# රෝස සුවඳැති ලේ

නෙත්මි ප්‍රනාන්දු

# පිදුම

සුවඳැති ප්‍රේමණීය ආත්මයන්ට......

## ස්තුතියි

'ජීවිතය කියන්නෙ එහෙම දෙයක් ක්ෂීර සප්ත කළ බැඳීමක සිට, කඳුළු සප්ත කරන මරණය දක්වා නිවි නිවී දැවෙන්නටත්, දැවි දැවී නිවෙන්නටත් කියාදුන් සියලු දෙනාට ස්තුති වෙමි.

'ඔබ මගේ නිර්මිතය. ඔබ ගන්නා හරි වැරදි කුමන පියවරක් පසු පසම ජීවිතය පුරා ඔබව රැක ගනිමි'. මගේ වරදේ දණ්ඩනය ඔහු හිමි කරගනිමින් නිතර ජීවිතය උගන්වමින්, විටෙක මා හා උරණ වෙමින් නිතර සිනා සෙන්නට කියාදුන්, මා සිනාගස්සන්නට කතා ගොතන, මා සිනාගස්සන්නට නටන, අම්මා වෙනුවෙන් සින්දු හදන ඒවා කියා අපව හිනස්සන කැමිලියා මල් නොදුන්නත් පොරොන්දු රකින තාත්තාට ස්තුති කිරීම ප්‍රමාණවත් නැතත් ස්තුති වෙමි. ඔබට නොතිබුණු පොත් රාක්කය මට සාදා දී කියවන්නට ඉගැන්නුවාට ස්තුතියි.

'ප්‍රශ්නෙ මොකක් වුණත් මට කියන්න. දුකෙන් නම් ඉන්න එපා මට දුක හිතෙනවා. ඔයා දුකෙන් ඉන්නකොට' කියා නිතරම මගේ ඕනෑම ප්‍රශ්නයක් අසාගෙන ඉඳීමේ සිට පිළිතුරු සෙවීමට නිතර ඉදිරිපත් වෙන සෑම තත්පරයකම මා ළඟම රැඳෙමින්, ගෙවී යන ඇසිල්ල පවා නුඹ නැතිව කල්පයක් මෙන් දැනීමට ඉඩ හැරී, තාත්තා හා මා වෙනුවෙන් ඕනෑම අභියෝගයක් බාර ගැනීමට සූදානම්, අපව ඉවසන විටෙක රළු වන, නැවත හිනැහෙන ගිම්හානය, වස්සානය එකක් සේ පිළිඹිබු වන ලොව එකම නවාතැන වන අම්මාට ද තුති පිදීම ප්‍රමාණවත් නැතත් එසේ කරමි.

'පාසල කියන්නේ මෙහෙම තැනක්' යැයි කියාදෙමින් නිතර දරුවන් පසුපස පන්නා යමින් හොයා බලමින්, වැරදි කරන්නට හිත නොදෙන අවකාශයක් සැදූ, කෙටි කාලයක් තුළ

පාසලේ විශාල වර්ධනයක් කිරීමට වෙහෙස වූ මගේ පාසලේ ගුරු විදුහල්පති කන්‍යා සොයුරියට ස්තුති කරමි!

'පොතක් ලියන්න' යැයි මීට අවුරුද්දකට පෙර යෝජනා කෙරූ භාෂිණී ගුරු මෑණියන්ටද ස්තුති කරමි. එදා නොලීවත් මෙදා ලිවීම ගැන ඔබ සතුටු වන වග දනිමි. 'රටක් වටින පොතක්' ගැන අධ්‍යාපන අමාත්‍යාංශයෙන් කියූ විගස මට දුරකථන ඇමතුමක් ගෙන එය කියා, මටත් ලියන්න යැයි කියූ පුංචි අම්මාට ස්තුති වෙමි!

කලාව සිංදු කීම පමණක් යැයි සිතමින් සිංදු කියන රියැලටිකරුවන් පමණක් සිටින යුගයක මේ පිළිබඳ පළමු අදහස දැරූ අධ්‍යාපන අමාත්‍යංශයට හා අධ්‍යාපන අමාත්‍යවරයාට ස්තුතිවන්ත වෙමි.

'රෝල් මොඩල්' නැති ජීවිතයක පොත්වල පිටු අතර ජීවිතය කියාදුන් මා කිය වූ පළමු පොත 'මිරිඟුව' සිට 'can we dare to be true to ourselves' වන කිය වූ අවසන් පොත හා කියවමින් පවතින 'නිම්නාගේ ඉතිහාසය' තෙක් පොත් වලට හා කියවන්නට නියමිත පොත් වලට හා ඒවායේ රචකයන්ට ආචාර කරමි!

මනුස්සකම් හිතේ පිරුණු හිත්වලට ආචාර කරමි! ධනුද්ධරයාණෝ...... ජීවිතය පුරා හීයක ගැබ්කෙරූ මනුශ්‍යත්වයේ හීය මෙසේ අවකාශයට මුදා හරිමි!

# 1

"විශ්වාසය මතින් දේශපාලනය කරන එක කොයිතරම් බලාපොරොත්තු නැති තත්ත්වයකට අපිට ඇද දාලා තිබ්බත් විශ්වාසය මත දේශපාලනය කරන එක හරිම ශිෂ්ට ක්‍රමයක්. මොකද විශ්වාසය කියන්නේ ශිෂ්ට සමාජයක ලක්ෂණයක්. අපිට හැමෝමට ආදරය කරන්න පුළුවන් උණත් හැමෝමව විශ්වාස කරන්න බෑ. ඒ අතින් ගත්තම ආදරයට වඩා උඩ තැනක විශ්වාසය දිලිසෙනවා. දේශපාලඥයන් ශිෂ්ටත්වය තීරණය වෙන්නේ ඒ විශ්වාසයයි පොරොන්දුයි කොච්චර දුරට රකිනවද කියන එක මත. ඒක හොඳ මිනුම් දණ්ඩක්"

අදින් වසර දෙකකට පෙර සටහන් පොතේ තමාට සිතෙන දේ ලියන්න ඇරඹූ ස්වේතා දෑ අවුරුද්දක අගිස්ස දෙසැම්බර් 31 වන දින විශ්වාසය මත දේශපාලන කිරීම පිළිබඳ සටහනක් තැබුවාය. අවුරුදු ගාණක් තිස්සේ රැක බලා ගන්නා ඩස්ටි රෝසස් මල් පාත්තියත්, වැනිලා පාට බාබටන් මල් වලත් තිබුණ ජීවය මෙන්ම සිලිසිලියට සීන් නාද උපද්දවන වින්ඩ් චයිමයත් ඇගේ සිත පහන් කිරීමට සමත් විය.

ගේ නොපෙනෙන තරමට ගැසූ තාප්පයත් විවෘත කරන විට කන්දොස්කිරියාවක් නංවන ගේට්ටුව සේම බාබටන් මල් පාත්තියට යා බදව වැඩී තිබුණු සුවඳ විසිරවන සල්ගසත්, සල්ගසට යටින් එහි පාමුල තිබූ බංකුවක් ඇව කුඩා කාලයට ගෙනයාමට සූදානම් විය. නමුත් ඇගේ දැහැන බිඳිමින් කන්දොස්කිරියාව නංවමින් ගේට්ටුව පාර පැත්තෙන් විවෘත විය.

අත්දිග සුදු කමිසයක් ඇඳ එහි අත් වැලමිට දක්වා නවා අළුපාට කලිසමට ලෙදර් බෙල්ට් එකක් ද, ඒ පාටින් සපත්තු දෙකක් දමා සිටි ඔහු ගේට්ටුව විවෘත කර නැවත කාරයට නැඟී කාරය වත්තට දැම්මේය. ඈ හුනස්නෙන් නැගිට විසිත්ත කිමරයට දිව ගියේ ඔහුව පිළිගැනීමටය. අතින් රතු රෝස පොකුරක් ගත් ඔහු දුටු ඈ ගෙමිදුලට දිව ගියේ ඔහු විසිත්ත කාමරයට ඒමට පෙර ඔහුව මිදුලේදීම පිළිගැනීමටය.

“මලුත් අරං” ඈ ඔහුගේ අතැති රෝස පොකුර උදුරාගත්තාය.

“මල් නෙමෙයි. රෙඩ් රෝසස්” ඔහු තම අත් කලිසම් සාක්කුවට දමා ගනිමින් කීවේය.

ඈ මල් පොකුරත් ගෙන ගොස් සල්ගහ යට බංකුවේ වාඩි වූවේ රෝස මල් සුවඳ පෙනහැල්ල තෙක් ආශ්වාස කරමිනි.

“ඒ හුස්ම පහළට ගන්න හිතෙන්නෙ නැති තරම්” ඈ සිනාසුණාය.

“ඒත් හුස්ම පහළට නොගෙන බෑ” ඔහු ඈ ළඟින් වාඩි වූවේය.

“වෙඩින් ෆ්රොක් එක අයිවරි වයිට් නිසා මං හිතුවේ බොකේ එක රෙඩ් රෝසස් ගන්න. ඒත් ඉතිං අකී එක පාරට ඩස්කි රෝසස් බොකේ එකක් පෙන්නුවා. ඔයා ඉතිං දන්නවනේ ඩස්කි රෝසස් තියෙන තැනක මට බෑ වෙන මලක් තෝරගන්න. මං ඉතිං ඩස්කි රෝසස් වලට හා කිව්වා.”

"ඒ කියන්නේ මටත් ඩස්කි රෝස් එකක්ද සාක්කුවේ ගහගන්න වෙන්නේ" ?

"නැතුව ඉතිංල නැත්තං මිනිස්සු හිතයි වෙන කාගේ හරි මනමාලයෙක් මං බල කරල උස්සන් ඇවිත් කියලා." දෙදෙනාම එකවර සිනාසුණහ.

"අම්මා ඔයා එනකම් බලන් හිටිය මෙවන්. ගෙයි ඇතුළෙ ඇති. ගිහිල්ලා හම්බ වෙන්න"

තෙමසකට පසු එළඹෙන මංගල්‍ය දින වෙනුවෙන් දින ගණින මේ සොඳුරු යුවතිය ජීවිතය තුළ තමා ලද අඳුරුම පැල්ලම් මකා දැමිය හැකි පිරිමියෙකු හමුවීම පිළිබඳ ඇතිවූ ප්‍රහර්ෂය නම් මධුවිතෙන් මත්ව උන්නාය.

තම ජීවිතයේ අනාමික සටහන් නාමික කරනු වස් තම ජීවිතයට පැමිණි ප්‍රේමණීය ආත්මය ආදරයේ හිරිකඩවත් අප්‍රිය කළ සමයක තමාව ප්‍රේම වරුසාවක තෙමූ හැටි සිහි කරන මෙවන් දිනෙන් දින ඒ පිළිබඳ පුදුම විය. පුදුමයේ කෙළවර කිසිඳු පිළිතුරක් නැති මේ සොඳුරු ප්‍රශ්නය තම ජීවිතයේ ලද සොඳුරුතම ජයග්‍රහණය යැයි ඉටා සිටියේය.

☆☆☆☆☆☆☆☆

"ඔයාගෙ කවි කොයිතරම් බොළඳ උණත් දෙමළෙන් හිතලා, සිංහලෙන් ලියලා, ඉංග්‍රීසියෙන් විචාරය කරන එක මට ගොඩක් වටිනවා. අන්න එහෙමයි එයා කියන්නේ" මීනුකා හා ස්වේතා එකවර සිනාසුණහ.

"මොකද ළමයි කෑ ගහන්නේ ?" කවිතා තම දියණියන් දෙදෙනාගේ මහා හයියෙන් සිනාසෙන පුරුද්ද නැති කරන්නට උත්සහ ගත්තේ අවුරුදු 14ක 15ක සිටය.

"නංගි ස්කෝලෙ මැගසින් එකට සිංහල කවි ලියනවනේ. ඉතිං එයගේ සර් කියනවලු එයාට වටින්නෙම මෙයා දෙමළෙන් හිතලා සිංහලෙන් ලියන නිසාලු. මෙයා ලිට්රිජර් ක්ලබ් එකේ ඒවා ඉංග්‍රීසියෙන් විචාරය කරන හින්දා තවත් වටිනවලු" ස්වේතා කියවගෙන ගියා ය.

"එහෙම තමයි හැමදේම ලස්සන මිශ්‍ර උනාම. ඒකනේ මිනිස්සු පලතුරු වෙනම කනවට වඩා ෆෘට් සැලඩ් කන්න ආස" කවිතා පැවසුවේ තම දියණියන්ද සිනාගස්වමිනි.

කවිතා කාමරයෙන් පිටව ගියේ කිලිටි රෙදි ටිකක් රැගෙනය.

"අක්කා හෙට ජනවාරි පළවෙනිදා" මීනුකා ජනේලය වසමින් පැවසුවාය. ජනේලය වැසීමත් සමගම අඳුරේ ගිලුණු කාමරය ආලෝකවත් කිරීමට ඈ විදුලි බුබුළු දැල්වූවාය.

"ඉතිං?" ස්වේතා ඇසුවේ මෙවන් ගෙනා රෝසමල් තම මේසය මත කහ පාට පෝච්චියට දමමිනි.

"අලුත් අවුරුද්දේ අලුත් ප්ලෑන් මොනවද?" මීනුකා ඇසුවේ අඟකාර බැල්මක් හෙලමිනි.

"මගේ අලුත් අවුරුද්ද ආරම්භ වෙන්නේ මාර්තු 31 වෙඩිං එකෙන් පස්සෙ. මට නෙමෙයි ඔයාටනේ අලුත් ප්ලෑන්ස් තියෙන්න ඕන. මේ අගෝස්තු ඒ/ලෙවෙල් කරන්නෙ ඔයානේ" ස්වේතා ඇසක් ඉඟිමරමින් මීනුකාගෙන් ඇසුවාය.

"හරි, අලුත් අවුරුද්දේ තියෙන ප්‍රාර්ථනා මොනවාද?"

"හොඳ සමාජයක්" ඈ සිනාවක් පෑවාය.

හොඳ නරක සාපේක්ෂ වූ සමාජයක පොදු ප්‍රාර්ථනා පවත්වා ගැනීම පොදු සිහින දැකීමත් යහපත් සමාජයක් බලාපොරොත්තු වීමත් කෙතරම් අපහසු දැයි අත්දැකීමෙන් දැන උන් ඇය මෙවන් හමුවූ පසු ඒ පිළබඳ බලාපොරොත්තුවක් තබාගත හැකි බව උගත්තාය.

"ඔයත් තාත්තා වගේ වෙලා අක්කා" මීනුකා නෝක්කාඩු කීවාය.

"ඉතිං මොකද? තාත්තා හොඳ මනුස්සයෙක්. මම කැමතියි එහෙම කෙනෙක් වෙන්න. මනුස්සයෙක් කියල කියන්න පුළුවන් මනුස්සයෙක් වෙන්න"

"එයා හොඳ මනුස්සයෙක් වෙච්ච එකෙන් එයාටවත් අපිටවත් ලැබුණු දෙයක් නෑ. මේ දවස්වල මනුස්සකම හින්ද ප්‍රශ්න ගොඩකට මූණ දීලා ඉන්නේ"

"ඒ මොකද"?

"ඇයි අම්මා කිව්වේ නැද්ද? ඊයෙත් කෝල් එකක් ඇවිත් අර කම්පැණි එකකින්. තාත්තා ප්‍රෝග්‍රෑම්ස් වලට ගිහින් ළමයින්ට අර කෑම දෙන්න එපා. මේ කෑම දෙන්න එපා කියනවා. ඒ මිනිස්සුන්ගේ බිස්නස් අඩු වෙලා. ඒ මිනිස්සුන්ගේ කේන්තියත් සාධාරණයි" මීනුකාගේ කටහඬ නෝක්කාඩු ස්වරූපයක් ගත්තාය.

"ඊයෙත් තර්ජනය කරලද?"

"ඔව්!" ඇ සුසුමක් හෙලුවාය. අනේ මන්දා ඕවා නම්, පුළුවන් නම් තාත්තට කියන්න ඔය වැඩ නවත්තන්න කියලා. ඩොක්ටර් කෙනෙක් වුණාම මිනිස්සුන්ට ලෙඩ උනාම බේත් කරනව මිසක් අපිට ලෙඩ දාගන්න නරකයි".

"එයා ඩොක්ටර් කෙනෙක් විදිහට ජාතික වගකීමක් ඉෂ්ඨ කරන්නේ. මම ඒකට කැමතියි. ලෙඩ උනාම බේත් දෙන්න කලින් ලෙඩ වෙන එක නවත්තගන්න ඕනෙ. මට සතුටුයි මගේ තාත්තා ගැන. එයාගේ දරුවෝ ගැන විතරක් නෙමෙයි. මුළු රටේම මිනිස්සු ගැන හිතන කෙනෙක් එයා" ස්වේතාගේ දෙනෙත් බබලන්නට විය.

"ඒත් ඉතිං ඔය එයා රැකගන්න බලන දරුවන්ගේ දෙමවුපියෝ තමයි මෙනව හරි පොඩි වරදක් අපෙන් උනොත් දෙමළා කියලා බැනල යන්නේ." මීනුකා එවර කතා කළේ කේන්තියෙනි.

"අවුරුදු එකසිය ගාණක් විතර ඉඳන් පරම්පරා ගාණක් මිනිස්සුන්ගේ ඔළුවට දාපු දේවල් මුළුමනින්ම අයින් කරන්නත් බැනේ." ස්වේතාගේ හඬේ ඇති උපේක්ෂාවේ ජල බිඳු මීනුකාගේ කේන්තිය නම් අග්නි ජාලා නිවා දමන්නට සමත් විය.

"වෙලාවකට චූටි නංගී අඬනවා ඉස්කෝලෙ යන්න බෑ කියලා. වෙලාවකට නම වෙනස්කරගමුලු. කෝනාර්, සාවිත්‍රි කෝනාර් කිව්වම දන්නවලු දෙමළ කියලා" ස්වේතාගේ මුත්තා තම දරුවන් තිදෙනා හා බිරිඳ රැගෙන දකුණු ඉන්දියාවේ සිට ගොඩ බ ටදා පටන් ස්වේතාගේ පියා ශ්‍රී ලාංකේය සමාජයට නෑකම් කිවේය. නොදන්නා දේශයකට පැමිණ මුල් අද්දාගෙන එහිම හැදී වැඩී සිංහල හොඳට හසුරමින් සිංහල සමාජයට අනුගත විය. ඒ ගමනේ ළමා රෝග පිළිබඳ වෛද්‍යවරයෙකු වීම තෙක් ඔහුගේ ගමන ලේසි එකක් නොවිය. චිත්ත ධෛර්යකින් හා ප්‍රඥාවෙන් හෙබි මානව දයාවෙන් උතුරා යන ඔහු ලාංකික දෙමළ කාන්තාවක් විවාහ කරගෙන දරුවන් තිදෙනෙකුට පියෙක් විය. ඔහුගේ අනෙක් සොහොයුරන් දෙදෙනා දැනටමත් ඇමරිකාවේ මුල් අද්දාගෙන අවසන්ය.

"ඔය ප්‍රශ්නෙම කාලෙකට කලින් මටත්, දැන් ඔයාටත් තියෙනවා. ඒක එයාටත් පොදුයි. එයාටත් ජීවත්වෙන්න ඉගෙනගන්න දෙන්න" ස්වේතා දෙනෙත් පියාගෙන කීවාය.

## 2

"ජනවාරි පළවෙනිදා කියලා නෑ. අදත් කරන්න තියෙන්නේ වෙනද කරපු ටිකම තමා. ඊයේ රෑ දැක්කෙත් වෙනද දකින හීනෙම තමා. ඊයෙත් ගැස්සිලා ඇහැරුණා." මේලා පැවසුවේ තම සොහොයුරා මෙවන්ගේ කාරයේ ආසන පටි දමනවිටය.

"ඊයෙත් දැක්කද?" මෙවන් පුදුමෙන් මෙන් බැලුවේය.

ඇ දිනපතා වැඩට යන්නීය. පෞද්ගලික ආයතනයක රැකියාව කරන ඇ වෙහෙස වී වැඩ කළාය. නමුත් ඇය අකමැතිම දේ තමාගේ පැමිණීමේ ලේඛනයයි. එය රෑ හීනෙන් දැක ගැස්සී අවදි වෙන එක ඇගේ ජීවිතේම කොටසකි. පාසල් කාලයේදී ද නොකඩවා පාසල් ගිය ඇ පන්තයේ නාම ලේඛනය හීනෙන් දැක බිය වී ඇහැරුණාය. විවාහයෙන් පසුව තම ස්වාමිපුරුෂයා රැකියාව කරන ජපානයේ ගත කෙරූ කාලයේදී ඇ මේ හීනය නොදැක්කාය. එම නිසා බිය වී ඇහැරුණේද නැත. නමුත් එය නැති වීමද තම ජීවිතයේ අඩුවක් ලෙස ඇට දැනෙන්නට විය. දැනට ඇ තම දෙමවුපියන් හා සොහොයුරා සමඟ වාසය කරන්නීය.

ඇ ඇගේ කාර්යාල පරිශ්‍රයෙන් බැස ගියාය. කාර්යාලටය ඇතුළුවූ ඇ පැමිණීමේ ලේඛනය ලකුණු කළාය. තමාව සෑම රාත්‍රියකම බය කරවන එය දෙස දහවලේදී ඇ බැලුවේ සිනාපිරි මුහුණකිනි.

"හැපි නිව් ඉයර්" මේලා පළමුව දුටුවේ මල්කාන්තිවය.

මේලාගේ ජීවිතයේ පරම හතුරෙක් හෝ පරම මිතුරෙක් නැත. නමුත් කාලෙන් කාලෙට බිහිවන මිතුරන් හා හතුරන් උවමනාවටත් වැඩිය. නමුත් මේ පැය අට මිතුරුකම හෝ හතුරුකමට යටින් සියුම්ව දිවෙන අනෙකා කෙරේ උපදින ඊර්ෂ්‍යාව, තරඟකාරීත්වය ඈට බොහෝ දේවල් උගන්නා තිබිණි, අත්දැකීමෙන් ලැබූ ඉගැනීම තුළ ඈ පුරුදුව සිටියේ ෆැන්ටසිය දැක දෙනෙත් පියාගන්නටය. ඈ යථාර්ථයටද වෛර කළාය. ඈ ජීවත් වූයේ ය්ථාර්ථයත් ෆැන්ටසියත් අතර මැද දිවෙන පුළුල් වපසරියකය. එතුළ ඇත්ත බොරුව, ලස්සන අවලස්සන, ආදරය අනාදරය, වෛරය අවෛරය සෑම දේ සාපේක්ෂව දැකීමට හුරුව සිටියාය.

“විෂ් යු ද සේම්, මල්කි” ඈ සිනාවකින් සංග්‍රහ කළාය.

ඒ මේ අතින් ගලා ආ සුබ පැතුම් සමඟ ඈට ඇගේ මිතුරිය මානෙල් සමඟ කතාවට වැඩීමට ඉඩක් ලැබුණේ වැඩ ඇරී නිවසට එන පාරේදීය. තුංමං හන්දිය ළඟට එනතුරු ඔවුහු ඇවිද ගියහ. එතැනින් පසු මේලා කුලී රථයකට ද මානෙල් බස්රියට නැඟ නිවසට යාම සාමාන්‍ය සිරිත විය. පාසලේ එකම පන්තියක සිටියත් ඔවුන් මිතුරුකම ගොඩනගා ගත්තේ කාර්යාලයේදීය. කාර්යාල පරිශ්‍රයෙන් පිටවූ ඔවුන්ට කොළඹ රත් කරන, කොණ්ඩ තඹ කරන බැසයන හිරු රැසින් බේරීමට කුඩ ඉහළාගන්නට විය.

“මේ අවුරුද්දේ මට මුලින්ම විශ් කළේ අපේ නැන්දා හම්බවෙන හැමෝ එක්කම මට බැනලා, බැනලා කෝල් කරලා විශ් කරනවත් එක්ක” මානෙල් සිනාසෙමින් කීවාය.

“ඉතිං හොඳයිනේ මේ අවුරුද්දෙවත් නොබැන ඉන්න තීරණය කරලද දන්නෑ” මේලා සිනාසෙන්නට උත්සහ ගත්තාය.

“හෙටවත් පන්සල් යන්න ඕනේ”

“ඇයි?”

"ඇයි කියන්නේ? මේ අවුරුද්දෙවත් සාර්ථක වෙන්න කියලා ප්‍රාර්ථනා කරන්න. ආ! තව එකක් ඊළඟ අවුරුද්දෙවත් හිතින් විත කටින මිනිස්සු කිටින් සුබ පතන අවුරුද්ද නොවෙන්න කියලා"

"අටලෝ දහමට හුරුවෙන්න කියපු බුදුන්ගෙන් ද ඕවා ඉල්ලන්නේ?"

"ඔයාට මොකද ඉතිං" මානෙල් නෝක්කාඩු බැල්මක් හෙලමින් කීවාය.

"ඔයා දැක්කද නිව්ස් වල ඊයේ ලෝයර්ස්ලා දෙන්නා බැනගත්ත හැටි?"

"ආ! ඔව්"

"වැදගත් රස්සාවල් කරන මිනිස්සු ඔහොම කරනවද? උන් ඔය ජාතියක් ජන්මයක් නැති පරම්පරාවල අය. නැත්තං වැදගත් මිනිස්සු වෘත්තීමය ගෞරවය තියාගන්න ඕනේ"

"ඒ මිනිස්සුන්ගෙන් පරමාදර්ශී චරිත වෙන්න කියලා බලාපොරොත්තු වෙන එක වැරදියි. හැබැයි උගත්තු විදිහට උගත් කමට නම්බුවක් දෙන්න, වැරදි අඩුවෙන් කරන්න කියලා බලාපොරොත්තු වෙන එකේ සාධාරණයක් තියෙනවා"

මේලා සමග තර්ක කිරීම ඵලක් නැති බව දන්නා ඈ මුනිවත රැක්කාය.

"මං යනවා මේ පැත්තට බස් එක ගන්න" මානෙල් මේලාට සමුදුන්නාය.

මේලා පාර දිගේ ඇවිදගෙනම නිවසට යාමට තීරණය කළාය.

ඈ සෙමින් ඇවිද ගියාය. රජයේ සේවකයන් දෙදෙනෙකුට දාව උපන් සිංහල බොදු පවුලක වැඩිමහල් දියණිය වූ ඈ කොළඹ ප්‍රසිද්ධ පාසලක උගත්තාය. තමාට වඩා අවුරුදු හතරක් බාල එකම සොහොයුරා මෙවන්ව තම පවුලේ සුරතලා කරගනිමින් සැදූ හැටි සිහි කළාය. කුඩා කාලයේදී තමා පාසලට ගිය මේ පාර එකල පාලු වීදියක් බවත් දැන් එය එසේ නොවන බවත් ඈ සිතුවාය. අවුරුදු තිහක් සපිරුණු තම ජීවිතය තුළ තමාට මතක තිබෙන අවුරුදු 26 පමණ කාලයේ සිට වික්ටෝරියා හීල් පාරේ පටන් ගන්නා තැන

තිබෙන සුවිසල් නිවස එදා සිට අද දක්වාම අවුරුද්දට දෙතුන් වතාවක් පමණක් ඇරෙන විශාල ගේට්ටුවකින් වැසී තිබුණු හැටිත් එය භූත බංගලාවක් යැයි උපකල්පනය කරමින් ගෙතූ කතා කියමින් මෙවන්ව බය කෙරූ සැටිද සිහි කළාය. මෙවන් මේ දේවල් කෙතරම් විශ්වාස කළේදයත් ළමා කාලයේ ඔහු එතැන පසු කරන විට ඒ පැත්තවක් නොබැලීමට තීරණය කළේය. ඒ මහා බංගලාව පසු කරගෙන පැමිණි ඈ දුටුවේ අවුරුදු 30 පමණ පැරණි නම නොදන්නා ගසයි. ඒ ගස පාමුල තිබූ ගල් තමා ඇතුළු මිතුරන් පිරිසක් වාඩි වී කතා කිරීමට තනාගත් තැන බව ඇට සිහිවිය. කහ පාටින් පිරී ඇති ගස් අතරින් පතර කොළ පාටට ගසේ කොළ දුටුවාය. ගසේ මල් එල්ලෙන ආකාරය මෙන් ම ගල් මතද ගහේ පාමුලද වැටී තිබුණ මල් පෙති වලට ඈ පෙම් බැන්දාය. ඈ ඒ ගලමත වාඩි වුණේ අගල් 4 පමණ අඩි සපත්තුව ගලවා දමමිනි. තමා ඇතැති බෑගයද බිමින් තැබූ ඈ ගලමත වාඩි වූ විට මලක් ඇගේ උකුලට පතිත විය.

ඈට සතුටක් දැනිණි. පාසල් ගියේ සතුට සොයාගෙනය,විශ්ව විද්‍යාලයට ගියේ සතුට සොයාගෙනය, විවාහ වුණේද සතුට සොයන්නටය. හැම තැනම සෙවූ සතුට මේ ගස යට හමුවීම ගැන ඈ පුදුම වූවාය. එකෙණෙහිම දැනෙන කල කිරීමේ මුල බීජ උත්පාදනය පෙර දැණුන සතුටම විය. සතුටේ අගය දැනෙන්නේ දුකේදීය. සතුටද අර්ථ ශූන්‍ය බව දැනෙන්නේ සතුට තුළ හුස්ම ගන්න විටය.

ඈ මේ තිත්ත ඇත්තට තැති ගත්තාය. ඒ තැති ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස ෆැන්ටසියත් යථාර්ථයත් අතර ඈ තනාගත් ඇගේම ලොව තුළ ඈ තනි වන්නට උත්සහ ගත්තාය.

කොළඹ උගත් සිංහල මධ්‍යම පාන්තික පවුලක ඉපදී ඈ කුඩා කල සිටම උගත්තේ පරමාදර්ශී චරිත සෙවීමටය. ඉතිහාසය ඈට වීර මද්දුම බණ්ඩාර පරමාදර්ශී බව ඉගැන්වූ අතර විටෙක දුටුගැමුණු පරමාදර්ශී බව උගන්නන්ට විය. ඈ නව යොවුන් වියේදී ඈට රෝමියෝ පරමාදර්ශී විය. සාලිය පරමාදර්ශී විය. ඒ අතරතුර ඈ වර්තමානයේ සජීවී පරමාදර්ශ සෙවීමට උත්සාහ ගත්තයා. සෑම තත්පරයක පියා නිරීක්ෂණය කළ ඈ ඔහු තමා සොයන පරමාදර්ශී

නොවන වග තීරණය කළාය. පසු කලෙක ඇගේ නව යොවුන් චිත්ත සන්තානයේ මැවුණ රූපය ප්‍රතිමූර්තිය කරගෙන නව යොවුන් පෙමක පැටලුණාය. එය තම ජීවිතයේ සොයන පරමාදර්ශී හෝ ස්වර්ගීය සතුට නොවන බව වටහාගත් ඈ පසු කාලීනව තම පරමාදර්ශී චරිතය විශ්ව විද්‍යාලයෙන් සොයාගත්තාය.

විවාහයෙන් දෑ අවුරුද්දක කෙළවර විටෙක ඔහු ඒ ප්‍රතිමූර්තිය කඩා දැමුවේය. තවත් විටෙක ඒ ප්‍රතිමූර්තිය දිය කර හැරියේය. තවත් විටෙක ඒ ප්‍රතිමූර්තිය වාෂ්ප කර හැරියේය. විවාහයෙන් සිව් වසක අගිස්ස දැන් ඈ පරමාදර්ශය සෙවීමට උත්සාහ නොගනී.

නොකල්හි මුණගැහෙන අකල්හි පණ අදින තම සිතට පමණක් සීමා වූ ප්‍රතිමූර්තියම පරමාදර්ශී කොට දැක්කාය. වින්දාය.

"අක්කා, මෙතන මොනවද කරන්නේ?" ඇගේ දැහැන බින්දෙ ගැහැනු කටහඬකි.

"ආ! මීනුකා" ඈ කුලී රථය තුළ සිටි මිනුකාගේ මුහුණට එබුණාය.

"ස්වේතා ආවේ නෑ?" ඈ ගස පාමුල තැබූ බෑගය අතට ගනිමින් ඇසුවාය.

"නෑ. එයා ගෙදර"

"අපි යමු එහෙනම්" මෙලාද මීනුකාගේ කුලී රථයට නැංගාය.

# 3

"තමන්ට අසීමිතව ආදරය කරන මිනිස්සුන්ට අනුන්ට ආදරය කරන්න බෑ. තමන්ගේ මගේ කියල අසීමිත ආත්මාර්ථයක ඉන්න මිනිස්සු මහ අඳුරු අදේශපාලනයක ගිලිලා ඉන්න අය තමන් තමන්ට ආදරය කිරීම අනාචාරෙන් කරන්න ඕනෙ. එතන තමයි ආදරෙ මුල්ම පාඩම. තමන්ට වගේම අනුන්ටත්, සමහර විට තමන්ව පරයා අනුන් ගැන හිතන මිනිස්සුන්ටයි මම කැමති. ඒ වගේම තමන් මැරෙන්න අකමැතියි, හිංසනයට අකමැතියි කියලා මිනිස්සුන්ව නොමරා ඉන්න, හිංසනයට ලක් නොකර ඉන්න මිනිස්සු වගේම, තමන්ට ජීවත් වෙන්න ඕන නිසා අනුන්ව මරණ මිනිසුන් තමන්ට ආදරය කිරීමේ පාඩමේ අන්ත දෙකක් හදාරපු අය. තමන්ට ආදරය කිරීමේ ආදරේ පළමු පාඩම අනෙක් හැම පාඩමකටම වඩා වටින්නේ ඒ නිසයි.

"අදත් ඩක්කි රෝසස් පිපිලද අක්කා?"

"ඔව් හැමදාම වගේ" ස්වේතා සටහන් පොත වසමින් සාවිත්‍රී තම බාල සොහොයුරිය දෙස හැරුණාය.

ස්වේතා සාවිත්‍රීගේ මුහුණට එබුණාය. අවුරුදු පහළවක නව යෞවන වියේ මේ සොඳුරු යුවතියගේ මලානකව ගිය ඇස් සමාජය විසින් ඇව ඇද දැමූ සෝචනීය දුක්ඛප්‍රාප්තිය පිළිඹිබුව වග ඇ දැන උන්නාය. ස්වේතා හා මීනුකාට වඩා වෙනස් ඇ නිදිකුම්බා පත්‍රයක්

වැනිය. ස්වේතා හා මීනුකා බාහිර සමාජයෙන් ඇතිවෙන හිංසා පීඩා හෝ ප්‍රශංසා හෝ පිළිගැනීම් ආදරයෙන් හෝ වෛරයෙන් වැළඳ නොගත්තා සේම ඔවුහූ සුළඟ සේ කැපී පෙනෙමින් ජීවිතයේ ඉදිරියට ගියහ. විටෙක අකුණක් සේ එළිය විහිදවමින් බාහිරෙන් උත්තේජනය කෙරූ විස පිටතට වීසි කළහ. එළඹෙනා ඇසිල්ල තමා විසින්ම නිර්මාණ කරගන්නා එකක් මිසක බාහිර සමාජයට එයට කිසිඳු බලපෑමක් එල්ල කිරීමට ඉඩ නොදිය යුතුයි කියා විශ්වාස කළහ.

නමුත් පවුලේ කුඩාම සාමාජිකාව වන සාවිත්‍රි තම ජීවිතය තුළ බාහිර සමාජයෙන් ඇතිකරන බලපෑම් දැඩිව සිතටගත්තාය. ඒවා ඉදිරියේ නිදිකුම්බා පත්‍රමෙන් හැකිළුණාය. නැවත සුපුෂ්පිත වන ඇසිල්ලේ පවා රිදුම්දෙන අතීතයක් පරිබාහිර සමාජය කළ බලපෑම් සිය චිත්ත සන්තානය නම් දෙවොලේ ඇදහුවාය.

සිංහල කතෝලික පාසලක උගැනුම ලබන ඈ සිංහල බස හොඳින් කතා කිරීමට ප්‍රගුණ කර සිටියාය. නමුත් පාසලේදී පංතියේදී ද්‍රවිඩ මවුපියන්ට දාව උපන් නිසා ඇය සිංහල සමාජයේ සැඟවිණි. ඇය සැඟවීම තුළම ජීවිතය සෙව්වාය. ඒ සැඟවීම තුළම හුස්ම ගත්තාය. ඒ 'සැඟවීම' ජීවිතය කොට සැලකූ නිසා ඉස්පාසුවක් ලැබූ හැම විටෙකම සැඟවුණාය.

"මං කැමති හයිඩ් ඇන්ඩ් සීක් වලට" ස්වේතා කුඩා කාලයේ පැවසුවාය.

"මං කැමති හොයන්න බැරි තැනක හැංගිලාම ඉන්න" සාවිත්‍රි පිළිතුරු දුන්නාය.

ඇය තම අතීතය පිළිබඳ දැක්වූ අඳුරු හැඟීම නිසා ද වර්තමානය පිළිබඳ දක්වන අවර්ණ හැඟීම ද හේතු කොට ගෙන අනාගතය පිළිබඳ දැක්වූයේ ස්ථිර වූ අස්ථිර බවකි.

තමා උපන් දකුණු ඉන්දියාව හැරදමා තම මුත්තා ලංකාවට ඒමට ගත් තීරණය ගැන ඇය පසු වූයේ කනස්සල්ලකිනි. ඈ සිතුවේ ජීවිතය ඇත්තේ තමා කුඩා කල සෙල්ලම් කළ තැන්වල කියාය. ජීවිතය ඇත්තේම කතා නොකර ඇස් පියාගෙන හිත විවෘත

කරගෙන හිටපු තැන්වල කියාය. තම මුත්තා ඒ ලෙස මුල් අද්දාගත් රට හැරදා පැමිණීම ඈ අනුමත නොකළාය. ඈ ශ්‍රී ලංකාව තුළ තම කුඩා කාලය ගෙව්වාය. කරට කර සමාජය හා තරඟ නොවැදුණත් තම මතකයන් විඳින ඈට අවශ්‍ය වූයේ තම මුළු ජීවිත කාලයම මේ බිමේ ගත කිරීමටය. නමුත් බහුතර සමාජය තුළ සැඟවීම නිසාද, ඇතැම් විට ඇතිවුණු අපහසුතා නිසාද ඇගේ ඒ ලැදියාව ටික ටික අඩුවිය. එවිට රට හැරදා යාමට සිතුනද ඇගේ මුත්තා මෙන් එවැනි තීරණයක් ගෙන තවත් ඉදිරියට ඉපදීමට නියමිතව ඇති පරම්පරා ගණනක් අපහසුතාවයට පත් නොකළ යුතුයැයි සිතුවාය.

මේ සියල්ල අතරතුර ඈ තම පියා දැක මවිතයට පත්විය. වෙන රටක සිට පැමිණ මෙහි මුල් අද්දාගෙන වෛද්‍යවරයෙක් වී දැන් රූපවාහිනියට පැමිණ ළමා රෝග වෛද්‍යවරයෙකු ලෙස නිර්භීත ජීවිතයක් ගත කළ ඔහු පිළිබඳ ඈ පුදුම වූවාය. විටෙක තමාව තරයේ ප්‍රතික්ෂේප කරන බහුතරයක් ඇති සමාජයකට ආදරය කරන්නේ කෙසේ දැයි සිතුවාය. විටෙක තමාද එය පුරුදු විය යුතු යැයි සිතට කියාගත්තාය.

"නංගී, චූටි අක්කා කවි ලියනවා. ඒකෙන් එයා ඉස්කෝලෙ කැපිලා පේනවා. යාලුවෝ ඉන්නවා ඔයාටත් පුළුවන් ඔයා දක්ෂ කැමති දෙයක් කරන්න" ස්වේතා වෙනම කතාවකට මුල පිරුවාය.

"මට ඕවා තේරෙන්නේ නෑ අක්කා" සාවිත්‍රි ආත්මානුකම්පාවෙන් කතා කළාය.

"අක්කේ, මං ඔයාට කියන්න ආවේ හෙට මගේ යාලුවෙක් ගෙදර එනවා කියන්න." එයාගේ නම ආනියා"

"ආනියා?"

"මගේ ක්ලාස් එකේ කෙනෙක්"

ඔවුන්ගේ කතාවට බාධා කරමින් කන්දොස්කිරියාව නංවමින් පාර පැත්තෙන් ගේට්ටුව විවෘත විය. පුරුදු ලෙස මෙවන් තම කාරය පුරුදු තැන ස්ථානගත කළේය. ස්වේතා ගේ මිදුලට දිව ගියාය. සල් මල් ගහ පාමුල බංකුවේ වාඩි වුණු ඈ මෙවන් ඒ අසල වාඩිවෙන තුරු බලා සිටියාය.

"අද මල් නැද්ද?" ඈ ඇසුවාය.

"ඔය එහා පැත්තේ තියෙන්නේ ඩස්කි රෝසස් පාත්තියක්ම. මම රෙඩ් රෝසස් ගෙනාවත් ඩස්කි රෝසස් තියෙන තැනක ඔයාට බැනෙ වෙන මලකට කැමති වෙන්න" මෙවන් නෝක්කාඩු කීවේය.

මෙවන් බස්නායක පෞද්ගලික ආයතනයක රැකියාව කරන්නෙකි. කුඩා කල සිටම ඉහළ මධ්‍යම පාන්තික සිංහල බෞද්ධ පරිසරයක හැදුණු ඔහු ජීවිතේ මහ ගොඩක් දුකවත්, මහ ගොඩක් සතුටවත් අත් නොවින්දෙකි. කුඩා කල සිටම රටේ දේශපාලන තත්ත්ව, පොදුවේ මානව සමාජය පෙන්නුම් කළ යුතු මානව ධර්මතා පිළිබඳ මෙන්ම වර්තමාන තරුණ උදවිය මෙන් 'ක්‍රමයේ වෙනස්වීමක්' එසේ නොවේ නම් 'සිස්ටම් චේන්ජ්' එකක් බලාපොරොත්තුවෙන් සිටියේය. නමුත් ඔහුද ඒ ක්‍රමයේ වෙනස්වීම සඳහා ලබා දුන් එකම සහයෝගය ඡන්ද පොළට යාම පමණි. විශ්වාස තබා ලබා දෙන මනාපයෙන් මාස තුන හතරක ඇවෑමෙන් තමා පත්කරගත්තවුන්ට බැන වදිමින් ෆේස්බුක් ලිපි ලිව්වේය. ඔවුන්ට බනිමින් දේශපාලනය පිළිබඳ නෑදෑ හිතමිතුරන් සමග තර්ක කළේය. විටෙක තම ජීවිතය පිළිබඳ කළකිරුණේ තම ජීවිතයේ තිබුණ උත්තරීතර හීන මාස පඩිය වැනි සිල්ලර හීන ඉදිරියේ කිසිඳු වග විභාගයකින් තොරව පාවා පාවා දුන් හැටි, දෙන්නට නියමිත හැටි පිළිබඳ පශ්චත්තාපයෙනි.

නමුත් තම ගැඹුරු චිත්ත සන්තානයේ තමාගේ පසු ඒන්නට නියමිත රුහිරය දරා සිටින්නා හෝ සිටින්නිය වෙනුවෙන් යහපත් වූ සමාජයක් බලාපොරොත්තු වූවේය. මේ කිසිඳු කලකිරීමක් පිටතට නොපෙනෙන පරිදි නැවුම් සිනාවකුත් දිලිසෙන ඇස් දෙකකුත් හිමි ඔහු ජාතිය, කුලය, ආගම නොබලා සීමා මායිම් නොතකා මානව වර්ගයාට ආදරය කළේය.

ස්වේතාට මෙවන් මුණ ගැසුණේ කොළඹ වේදිකා නාට්‍ය පුහුණුවීමක් අතරතුරය. එය මෙවන් රඟ දැක්වූයේ ද්‍රවිඩ තරුණයෙකුගේ චරිතයයි. එහි අත්වැල් ගායනයෙන් සහභාගී වූ ද්‍රවිඩ තරුණිය මේ සිංහල තරුණයා දෙමළ උෟරුවට සිංහල උච්චාරණය

කරන හැටි පිළිබඳ පුදුම විය. දෙදෙනා කතා කෙරූ පළමු දිනයේ ඇ පැවසුවේ "මං හිතුවේ ඔයා ඇත්තටම දෙමළ කියලා" කියාය.

"සිංහල මිනිස්සුන්ට දෙමළ උෟරුවට සිංහල හොඳට කතා කරන්න පුළුවන්. 'මහත්තයාට' 'මාත්තියා' 'ඒකට' 'යේක' වගේ වචන" ඔහු ඇට පැවසුවේ සිනාසෙමිනි.

ඔවුන් දෙදෙනා තමා තුළ ඇති ඒ සංස්කෘතිකමය පටලැවිල්ලට ආලය කළහ. ඒ සංස්කෘතිකමය පටලැවිල්ල ලිහා ගන්නවා වෙනුවට ඔවුන්ට අවශ්‍ය වූයේ එතුළ තවත් පැටලීමටය.

ඔවුන් දෙදෙනාගේ මේ සම්බන්ධයට බස්නායක පවුලෙන් දක්වන්නට නියමිත ප්‍රතිචාරය පිළිබඳ තැති ගැනීමකින් සිටි කාලයක් විය. නමුත් ස්වේතාගේ පවුල් මට්ටම නිසා බස්නායක පවුල මේ පිළිබඳ කිසි විරෝධයක් පළ නොකළහ.

ඇ ඔහු පිළිබඳ හොඳින් දැන උන්නාය. ඇ ඔහුගේ මුහුණේ තිබූ පීඩාකාරී බව පිළිබඳ විමසුවාය.

"අද මොකක් හරි ප්‍රශ්නයක්ද? "

"නෑ අද ආදිත්‍ය එක්ක එයාගේ නම වෙනස් කරන්න කියලා ගියා. එතන ටිකක් රස්තියාදු වුණා. ඔලුව රිදෙනවා"

"නම වෙනස් කරන්න? ආදිත්‍ය කියන්නේ හොඳ නමක්නේ"

"ආහ්! වාසගම වෙනස් කරන්න"

"ඒ මොකද?"

"එයා සිල්වා. ඉතිං ඒක අඩුකුලේ ද, මොකක්ද ලු ඒ හින්දා ඉතිං ජයවර්ධන කියලා වාසගම වෙනස් කරගෙන. දේශපාලනයටත් එන්නෝනලු. හොඳ තැනකින් කසාදයක් කරගන්නත් ඕනලු."

"එතකොට පවුලේ අය"

"පවුලෙ ඉන්න එකම ළමයා එයානේ. තාත්තා මැරිලා. අම්මත් අවුලක් නෑ."

"සිංහල අය මොකටද වාසගම් වෙනස් කරන්නේ? මට නම් තේරෙන්නේ නෑ" ඇ කිවාය.

"එහෙම තමයි ස්වේතා අපේ සමාජේ හැටි. මිනිස්සුන්ව ජාතියට බෙදනවා. ආගමට බෙදනවා. හමේ පාටට බෙදනවා. පස්සේ සමාජ මට්ටමට බෙදනවා බෙදන්න තැනක් නැතිවෙනකම් බෙදලා අන්තිමට සර්නේම් එකටත් ලේබල් ගහනවා. බේදිලා බේදිලා අන්තිමට ගෙදර ඇතුළෙ මිනිසුත් බේදිලා යයි"

"ඒත් ඉතිං ආදිත්‍යට තියෙන්නේ දේශපාලනික ප්‍රශ්නයක්. දේශපාලනය කරන්න ඕන හින්ද මිසක් වාසගම නිසා එයාව කවුරුත් කොන් කරලා නැනේ" ඈ පැවසුවාය.

"ඒකට හේතුව මොකක් උනත් මිනිස්සු ජාතිය, කුලය හරි දෙයක් පදනම් කරන් තව කෙනෙක්ව තලන්න, පීඩා කරන්න උත්සාහ කරන ලෝකයක අපි ජීවත්වෙන නිසා තමා එයා ඒකට පෙළඹිලා තියෙන්නේ"

"ඒක කෝම උනත් අපේ අම්මා කියන්නේ තමන්ගේ වාසගම වෙනස් කරන්න පුළුවන් මිනිහට අම්මව උනත් අමතක කරන්න පුළුවන්ලු. ඒත් මං දැන් දන්නවා හුඟක් මිනිස්සුන්ට ඒ තත්වෙ උදා උනේ එක්කො නොමැරී ජීවත් වෙන්න නැත්තං තමන්ගේ නමින් උපදින ඉදිරි පරම්පරාවට එන්න තියෙන අභියෝගවලින් එයාලව ආරක්ෂා කරගන්න කියලා"

"ඔව්, අපිට ඕනේ වාසගම මිනිස්සුන්ව මනින මිනුම් දණ්ඩක් නොකරගෙන ජාතිය, කුලය අනුව චරිත නොදෙන දකුණෙ කෙළවරේ සහතික උනත්, උතුරු කෙළවරේ උනත් වැරැද්දක් වැරැද්ද වැරද්ද විදියට දකින්න පුළුවන් මිනිස්සු. ඒකෙන් වෙන සමාජ පරිහානිය ජාතිය අනුව සාධාරණීකරණය නොකරන සමාජයක්"

"පොදුවේ සමාජය 100% වෙනස් කරන්න බැරි වුණත් හැම තත්පරයකම එක කෙනෙක්ට හරි ඔලුවට යහපත් දෙයක් දාන්න පුළුවන් නම් ඒක වටිනවා. ඊළඟ පරම්පරාවලටත් නිදහස් මනුස්සකමින් ජීවත් වෙන්න පුළුවන් සමාජයක් ලැබේ" ඇය තමා අතේ තිබූ සල්මල ඔහු අතට දෙමින් ඇගේ හිස බංකුවට බර කළාය.

★★★★★★★★

"ඉතිං මොකද  හදිස්සියේ මාව හොයාගෙන ආවේ? අපිව ඉතිං මතක් වෙන්නෙ වැඩකදිනේ" මේලා ඇසුවේ මීනුකා සමඟ ගෙට ගොඩ වෙමිනි.

"මේ පාර එක්සෑම් නේ අක්කා. ඉතිං වැඩ වැඩියි. මං මේ ආවේ නෙරුඩාගේ කවි පොත ඉල්ලන් යන්න. ඉක්මනින් යන්නත් ඕනේ අම්මා බලන් ඉන්නවනේ" ඉස්පහසුවක් නැතිව මීනුකා කියාගෙන ගියාය.

මේලා පහසුවෙන් පොත් රාක්කය දිගේ අත යවා නොරුඩාගේ කවි පොත මීනුකාට දුන්නාය.

"පැබ්ලෝ නොරුඩා! ඔයා ඕක තියාගන්න" ඈ සිනාවක් පෑවාය.

"කමක් නැද්ද?" මීනුකා පොත දෙස බලමින් ඇසුවාය."

මීනුකාගේ ප්‍රශ්නයට සිනාවකින් සංග්‍රහ කළ ඈ ඊට සිනාවෙන් පිළිතුරු දුන්නාය.

මීනුකා කුලී රථයට නැඟී පිටව යනතුරු මේලා උළුවස්ස ළඟට වී බලා සිටියාය. වාහනය හංදියෙන් නොපෙනී යනතුරු අත වැනුවාය.

# 4

අඳුරේ ගිලී තිබූ කාමරය එළිය කරමින් කවුළු පියන හැර තිබූ කවුළුවෙන් සඳ එළිය ගලා එන්නට විය. ඒ කෙළවරේ කුඩා විදුලි ලාම්පුව ලඟ පොතක් කියවමින් සිටි තම පියාගේ සේයාව හරි හැටි දැකගත නොහැකි නිසා කිසිඳු විමසීමකින් තොරව සාවිත්‍රි විදුලි බුබුළු දැල්වූවාය. ඒ ගලා ආ ආලෝකය දරාගෙන නොහැකිව වෛද්‍ය හර්ෂදේවන් කෝනාර් හෙවත් සාවිත්‍රිගේ පියා තිගැස්සුණේය.

"අප්පා, අම්මා කතා කළා කන්න" ඔහු එකෙනෙහිම අසුනෙන් නැගිට සාවිත්‍රිව අල්ලා ගත්තේය.

"අපි යමු" දෙදෙනාම කාමරයෙන් පිටතට ආවේ කෑම කාමරයට යාමටය.

සියලු දෙනා ආහාර ගෙන අවසානයේ හර්ෂදේවන් කෑම මේසයෙන් නැගිට්ටේය. එකෙණෙහිම නාද වූ දුරකථනයට පිළිතුරු දීමට මීනුකා ඒ අසලට දිව ගියේ කාටත් ඊට ඉඩ නොතබමිණි. ඒ තත්පරය තුළ ගෙදර දොරේ සීනුව නාදවිය.

"මං බලන්න යන්නම්" කියමින් හර්ෂදේවන් දොර හැරීමට ගියේය.

"අම්මා....." මීනුකාගේ ස්වරය ස්වේතා, කවිතා මෙන්ම සාවිත්‍රිවද තිගැස්සුවේය.

"මොකද මීනු ......" කවිතා ඇය අසලට දිව ගියාය.

ඇගේ බිය වී ප්‍රමාණයෙන් විශාල වූ දෙනෙත් සාවිත්‍රි දුටුවේ සුදුපාට අහසක කළුපාට හඳක් මෙනි. ඒ දෙනෙත් අතරින් මීනුකාට නොදැනීම කඳුළු බිඳුවක් ගලා එන්නට විය. ඇය දුරකථනය පැත්තකින් තබා කවිතාගේ ඇඟට බර විය. ඒ අතරතුර හර්ෂදේවන් නැවත නොපැමිණීමත්, කිසිම ප්‍රතිචාරයක් නොලැබීමත් නිසා කවිතා බිය වූවාය. ඔවුන් සිටිය කෑම මේසය ළඟට නිවසේ දෙරටුව නොපෙනෙන නිසා ඈ සිටියේ කනස්සල්ලෙනි.

"ස්වේතා, අප්පා කෝ කියලා බලන්න"

"මීනුකා මොකද දරුවෝ වුණේ?" ඈ තාමත් සිටින්නේ කවිතාට බරවීය.

ඈට පිළිතුරක් ලබා දීමට ඉඩ නොදීම ස්වේතා ප්‍රධාන දොරටුවේ සිට කෑ ගැසුවාය.

"ආනේ අම්මා එන්නකෝ"

සියල්ලට ප්‍රථම මීනුකා එතැනින් දිව ගියේ  ප්‍රධාන දොරටුව පැත්තටය.

කවිතා සහ සාවිත්‍රි ඈ පසුපස වැටෙන්නට විය. කෑම මේසයේ ඇති කෑම කාමරයේ සිට ප්‍රධාන දොරටුවට ඇති දුර ප්‍රමාණයෙන් වැඩියි යැයි කවිතා ප්‍රථම වරට සිතුවාය. ඈ එතනට යන විටත් මීනුකා හර්ෂදේවන්ව බදාගෙන හඬමින් උන්නාය.

"දුව අඬන්නේ මොකද? අඬන්න තරම් දෙයක් උනේ නෑ" හර්ෂදේවන් තම පපුවට තුරුළු වී සිටි මීනුකාගේ මුහුණ තමා දෙස හරවාගනිමින් ඇසුවේය.

"අනේ මොකද උනේ කියන්නකෝ" කවිතාද හර්ෂදේවන් ලඟට ආවාය. එවිට ඈ ඉස්තෝප්පුවේ තිබූ මල් වඩම දුටුවාය. ඇගේ හුස්ම තත්පරයකට නතර විය. හිසෙන් පටන්ගෙන පාදාන්තය දක්වා අකුණක් ගැසුවාක් මෙන් දැණින. එහි දමා තිබූ කොළ කැබැල්ල අතට ගත් කවිතා එය කියෙව්වාය.

Rest In Peace!

සාමයේ සැතපේවා!

සටහන දුටුවිට ඇගේ දණහිස වාරු නැතිව බිම ඇදගෙන වැටෙනවා මෙන් දැනිණ.

"මොනවද හර්ෂ මේ වෙන්නේ?"

ස්වේතා එතන තිබූ බිත්තියට බරවී තම ශරීර ස්කන්ධය බිත්තියට දෙමින් හිටගෙන සිටීමට වාරු සෙව්වාය.

"අර ආපු කෝල් එකෙන් කවුද කිව්වා ජීවත් වෙලා ඉන්න කැමති නම් සල්ලි අරගෙන කට වහගෙන ඉන්න කියලා තාත්තට කියන්න කියලා" මීනුකා කඳුළු පිසදමමින් කීවාය.

කවිතා තම දොරකඩ තිබූ මල් වඩම වත්තට විසිකළාය. ගේ ඇතුළට දිවගිය ඈ එහි අටවා තිබූ ප්ලාස්ටික් රඳවනට කඩා දැමීමට පොල්ලක් රැගෙන ආවාය. එම මල් තැලී පොඩිවන තෙක් ඒ ප්ලාස්ටික් බට තැලෙන තුරු එය තැලුවාය. ඇගේ ශරීරය තුළ කැකෑරෙන බය , කේන්තිය එකක් කරගත් ගැහැණු ආවේශය හා ශක්තිය යකඩ හෙල්ලට ආශක්ත කර එය තලා දැමුවාය. එය එතනම ගිනි තැබුවාය. ඈ ඉස්තෝප්පුවේ සිට බලා සිටි ස්වේතා, මීනුකා සාවිත්‍රි දෙස නොබලාම හර්ෂදේවන්ව වැළඳගත්තාය. ඒ තම ආදරය අවදානම් කලාපයට ඇතුළු වූ ප්‍රේමයෙන් ආශක්ත වූ ගැහැණු ශරීරය ඒ අවධානමට ආවේගයෙන් ප්‍රතිචාර දක්වන අන්දමය.

හර්ෂදේවන් ඇව දකුණතින් අල්ලාගෙන ඇගේ පිටපුරා වැටී තිබූ කෙස්වැටිය ඇගේ දකුණු උරහිස හරහා පහළට වැටෙන සේ සැකසුවේය.

"අපි ඇතුළට යමු"

☆☆☆☆☆☆☆☆

"මල්ලි ඇතුළට එන්න" තම සිතේ විනිවිද දැකීමට දී X-කිරණක් ලෙස  ඇතුළු වීමට සඳට ඉඩදී ඔහේ බලා සිටි මෙවන්ගේ සිත් දැහැන බින්දේ මේලාගේ කටහඬයි.

"අක්කා මෙහෙ එන්නකෝ" ඔහු මේලාට කතා කළේය.

වත්තේ සිමෙන්ති බංකුවේ වාඩි වී සිට මෙවන්ගේ මුහුණ හොඳින් බලා ගත හැකි තරමට එළියක් වත්තේ තිබිණි. ඒ එළිය පාරේ විදුලි බුබුළු නිසාද සඳ එළිය නිසාදැයි මේලාට තිබුණේ සැකයකි.

"දිගු වූ රැයක සඳ එළිය මොටද රැය නින්දට පමණක් වෙන් කෙරූ බිමක" ඔහු ඇය දෙස බලමින් කීවේය.

"රැය ගෙවී අවසන සඳ දෙස බලමින් නිදි වැරූ නෙත නෙත් සඟවමින් මම සිඹිබි හිරු කිරණ නැවත නැග එන තෙක් සඳ අහසට" ඇය පැවසුවේ අහස දෙස බලාගෙනමය.

"එළිවැට රකුණ කවියක්

සිල්පද රකුණු දිවියක්

රති රැගුම් අකැප සඳ එළියක්

බුදු බව නොපතා ම කළ අභිනිශ්ක්‍රමණයක්" ඔහුගේ හඬ සුළඟට මුසුවීය

"බුදු බව නොපැතූ අභිනිශ්ක්‍රමණ මොටද

ගැහැණු දෙපයකට සිර නොවුණු වෙලෝවක් මොටද

සිහින ආලිංගනයෙන් කිතිනොකැවුණු රොමෑන්තික රාත්‍රිය මොටද

ඔහු නමින් සේද යහනාවට නොගැලූ රුහිරය මොටද"

ඇ මෙවන් දෙස නොබලාම කීවාය.

"අක්කා සතුටින් නේද?" මෙවන් ඇගෙන් ඇසුවේය.

"වෙන්නැති" ඈ හැඟීමකින් තොරවම පැවසුවාය.

"ප්‍රශ්නයක් තියෙනව නම් කියන්න" ඇගේ උරහිස වටා අත යැවූ මෙවන් ඇසුවේය.

"මෙවන් , සතුට තියෙන්නේ හිතේ. වෙලාවකට මට මගේ හිත දැනෙන්නේ නෑ. එහෙම වෙලාවට මං කවුද? සතුට මොකක්ද කියලා දන්නේ නෑ. ඒවගේ ප්‍රශ්නයක් මිසක් දුක හිතෙන්න තරම් ප්‍රශ්නයක් නෑ"

"ඔයාට අකිල අයියා එක්ක ජපානෙට යන්න තිබ්බේ. එයා ඔයාගෙ හස්බන්ඩ්. ඔයාට එහේදී ඔහොම ප්‍රශ්නයක් නැති වෙයි." ඔහු එසේ පැවසුවේ තමා ලබා දුන් පිළිතුර ප්‍රශ්න රැසකට දොරටු විවර කරයිදැයි කුහුලෙහි.

"එහෙම බෑ. මට හුස්ම ගන්නවා කියලා දැනෙන්නේ ලංකාවෙ ඉන්න කොට"

"මේ පුංචි රට අපිට මෙච්චර දේවල් ඉගෙන්නුව නම් මෙතනින් එහාට තියෙන ලෝකය අපිට කොච්චර දේවල් උගන්වයිද?" ඔහු ඇට පැවසුවේය.

"මේ පුංචි රට ඇතුළේ අපේ හිත් මෙච්චර රිදුණා නම් ඒ ලොකු ලෝකය ඇතුළේ අපේ හිත් කොච්චර රිදෙයිද?" ඇය පැවසුවේ තම උරහිස මත තිබූ මෙවන්ගේ අතෙන් මිදෙමිනි.

"ඔයාට ඔච්චර දුක්වෙන්න තියෙන හේතුව මොකක්ද?" එවර ඔහු සිටියේ කේන්තියෙනි.

"මං දුකෙන් ඉන්නවා කියන්නේ කවුද? මං කැමති මේ ජීවිතේට වැඩට ගිහින් පොතක් කියවලා, වේදිකා නාට්‍යක් බලලා ඉන්න එකට" ඈ ඔහුගේ කේන්තිය මායිම් නොකරම පවසමින් එතැනින් පිටවී ගියාය.

මෙවන් මේලා පිළිබඳව ඇගේ අතීතය පිළිබඳ සිහි කළේය. සාමාන්‍ය පෙළින් පසු මුල් මාස තුන විද්‍යා විෂය ධාරාව හැදෑරුවාය.පසුව වාණිජ්‍යට මාරු වූවාය. ඇය තීරණය අතීරණය අතර වපසරිය තුළ කම්පනය වන කතක් වැනිය. ඒ කාලය තුළ ඈ හෙම්බත් වූවාය. ඒ හේතුව නිසා පමණ ඉක්මවා ලැබූ දැඩි දඬුවම් ඇව ජීවිතය පිළිබඳ සිතන්නට පෙළඹවන්නට ඇත. පසු කාලීනව ද ඈ යමක් ලැබෙන තුරු ඒ පිළිබඳ සිතන්නට ද ඒ ගැන දැඩි ආශාවෙන්ද එය ලැබුණු පසු ඒ පිළිබඳ අංශුවකුදු තැකීමක් නොකළාය. එය ඇට නොලැබුණොත් ඉච්ඡාබංගත්වයට පත් වී

ඔහේ බලා සිටියාය. ජීවිතය තුළ ඇට ලැබෙන දේට සාපේක්ෂව නොලැබෙන දේ වැඩිවිය. පසුව ඇයට නොලැබීමද ඇඟට පත්තියම් විය. පසුව ඈ තේරුම් ගත්තේ තමන් ජීවිතයෙන් කිසිවක් බලාපොරොත්තු නොවන තෙක් ජීවිතය තමන්ගෙන්ද කිසිවක් බලාපොරොත්තු නොවන වගය. බලාපොරොත්තු හා ගැටීමද, ගැටීම හා රිදීමද, අවම වූ අවකාශය තුළ ඈ ජීවිතය හා යහපත් සබඳතාවක් ගොඩනගා ගත්තාය. නමුත් එහි පිටත ස්වරූපය මෙවන්ගේ සිතට ගෙන ආවේ දුකකි.

# 5

"කවුරුත් නිසා අපේ ජීවිත අනතුරේ දාගන්න බැනේ හර්ෂ. ඕක නවත්තන්න. අපි අපේ පාඩුවේ ඉමු" කවිතා සෝෆාවට බර වී සිවිලිම දෙස බලාගෙන කීවාය.

එදා රාත්‍රිය ඔවුන් කිසිවෙකුට නිදහසේ හුස්ම ගන්නට ඉඩ නොදුණි.

"අප්පා හිතනවද ඔය කිරිපිටි වර්ග හරි ඔය කියන කෑම හරි කන්න එපා කියලා අප්පා කිව්වා කියලා මිනිස්සු ඕවා ගන්නේ නැතුව ඉඳීවි කියලා" ස්වේතා ප්‍රශ්න කළාය.

"ඔව්. කම්පැණිවල බිස්නස් අඩුවෙච්ච නිසයි රිඇක්ට් කරන්න අරන් තියෙන්නේ." මීනුකා පිළිතුරු දුන්නාය.

ඔහු සිතුවේ එය තමාගේ යුතුකම කියාය. තම මව්රට කොහේ වෙතත්, ජාන භූමිය, ජන්ම භූමිය කොහේ වෙනත් ඔහු මේ ලක් භූමියට ප්‍රේම කළේය. සමාජයේ ප්‍රතික්‍රියාව ගැන නොතකා ඔවුන් වෙනුවෙන් වෙහෙස වුණේය. ප්‍රසිද්ධියේ ළමුන්ට අහිතකර කෑම, කිරිපිටි වර්ග, රසකාරක පිළිබඳ ජනතාව දැනුවත් කළේය. ජීවිතය පුරා ඔහු දුටු සමාජයට වඩා හොඳ සමාජයක් වෙනුවෙන් තමාගේ කොටස කළේය. ඒ වෙනුවෙන් වෙහෙසුණේය. ඒ සඳහාම ඔහුගේ මුහුණු පොත වෙන් කළේය. පත්තරයට ලිව්වේය. නමුත් හුදු සිල්ලර සිහින වෙනුවෙන් තම වස්ත්‍ර උනා දැමූ නිරුවත් ව්‍යාපාර මේ උත්තරීතර හීනයට බිය ගත් සේයාවක් තිබිණ. ඒ ව්‍යාපාර හිමිකරු

ඔවුන්ගේ අඳුරු කුටියට වැටෙන මේ ක්ෂුද්‍ර ආලෝකය නිසා උන්ගේ නිරුවත් සිරුරු සමාජය දකීයි යැයි බිය වූහ. මේ ක්ෂුද්‍ර ආලෝකය ගින්නක් ව ඔවුන් දවා හළු කර දමයි යැයි බිය වූහ. එහෙතු කරගෙන මාස හයක සිට තර්ජනය කරමින් ආ දුරකථන ඇමතුම් බොහෝය. එලෙසම ඔහුගේ සේවය අගයමින් ලියුම් ලිව්වෝද දුලබ නොවූහ.

නමුත් මහ රෑ ඉස්තෝප්පුවේ තබා ගිය මල් වඩම අනාගතය ගැන පේන කියන බවත් අනාගත බේදයට තබා ඇණ ගැසූ ඇගේ ගත සිත දෙකම අප්‍රාණිකව ඇති බවක් කවිතාට දැණින. ලන්ඩනයේ කොහිනූර් දියමන්තිය සේ රැකගෙන, පැරීසියේ අයිෆල් කුළුණ මෙන් ශක්තිමත්ව, ඉසුරුමුණියෙ සේ රැඳී හැරදා නොයා ඈ රැකගත් ඇගේ පවුල පිළබඳ බියට පත්වුණි. ඇහිපියල්ලක් යට හුස්ම අයදින මනුෂ්‍යත්ව පිළිබඳ ඈ සැක කළාය. ඒ සියල්ල පරයා යම් විටෙක තම ස්වාමියාගේ හදවත පසාරු කරගෙන යනවා යැයි කියූ උණ්ඩය ඇගේ හදවත මොහොතකට නතර කළේය.

“ඔය දේවල් නවත්තන්න. ඔයාට මොනව හරි උනොත් ඔය කවුරුත් නෑ අපිට”

හර්ෂදේවන්ගේ මුනිවත රැකීම සාවිත්‍රිට තවත් ඉවසිය නොහැකි විය.

“අප්පා පොරොන්දු වෙන්න ආයෙම මොනවත් fb එකේවත්, පත්තරේවත් දාන්නේ නෑ කියලා. ටී.වී. ප්‍රෝග්‍රෑම්ස් වලට යන්නෙත් නෑ කියලා.” සාවිත්‍රි ඔහුව තදින් වැළඳගත්තාය. මීනුකා හා ස්වේතා ද පියාව වැළඳගත්තේ උතුරාගිය සෙනේබියකිනි.

ස්වේතාගේ දෑස් කෙළවරින් කඳුළු බින්දුවක් ඇද වැටිණි. ඔහු පොරොන්දුවක් නොවූ බව ඈ දනී. ඔහු කතා නොකළත්, පොරොන්දු නොවුණත් කළ යුතු නිවැරදිම දේ කරන බව ඈ විශ්වාස කළාය.

සතියක් යනතුරු නිවසේ කිසිවෙක් වැඩි කතා බහක් නොයෙදුණහ. ස්වේතා තම පියාගේ මුහුණුපොතේ කිසිඳු සටහනක් ද නොදැක්කාය. ඔහු පත්තර සම්මුඛ සාකච්ඡා ප්‍රතික්ෂේප කළේය. සතියක් තුළ ඔවුන්ගේ ජීවිත මහ සයුර මෙන් හැඟීවම් සඟවාගන්නට උත්සාහයක යෙදීය. එකිනෙකා තුළ කවුරුත් කිමිදෙන්නට උත්සාහ නොකළේද තමාගේ චිත්ත සන්තාපවත් දරාගත නොහැකි

මොහොතක හෙම්බත්ව සිටිනා නිසා කාලය ගෙවී යන්නට ඔහේ ඉඩ දිමෙනි.

සතියකින් කිසිවක් තම සටහන් පොතේ සටහන් නොකළ නිසා ස්වේතා එය අතට ගත්තාය.

"සමාජයට ආදරය කරන මිනිස්සුන්ට සමාජය ආදරේ නැද්ද? තමන්ගේ ජීවිතේ හැම තත්පරයකම අනුන් වෙනුවෙන් දෙයක් කරන්න හදන මිනිස්සු වෙනුවෙන් සාධාරණය ඉල්ලන්න ඒ වෙනුවෙන් හිටගන්න තරම් නිර්භීත සමාජයක් හැදෙනකම් ආදරය, ප්‍රේමය, මෛත්‍රීය, දයාව වගේ හැමදෙයක්ම පරයා යකඩ බව, වෙඩි උණ්ඩ ඉස්සරහට එන එක නවත්තන්න බැරි වෙයි. නමුත් සියලු මානව ධර්මතා සිඳී බිඳී කැඩී ගිය කාලයක පවා මානව ධර්මතා සිඳී බිඳී කැඩී ගිය කාලයක පවා මානව ධර්මතා වලට හුස්ම දෙන්න වෙහෙසිලා හුස්ම ගිය මිනිසුන්ට සමාජයක් විදිහට අපි ණයගැතියි. ඒ මිනිස්සුන්ව නිර්මිත පුද්ගලයන්ට වගේම, ඒ මිනිස්සුන්ගේ නිර්මිත වලට අපි ණයගැතියි. අතීතය, වර්තමානය, අනාගතය යන තුන්කල්හිම තමන් හීන දැකපු යහපත් සමාජය බිහි කරන්න මහන්සි වුණු ආදරණීය ආත්මයන්ට අප නොලත් ඒ සාමය ලැබේවා!''

ඇගේ මනසේ තිබූ සියල්ල ලියා දමන්නද, දමා ගසන්න දැයි සිතූ ඈ සටහන අවසන ඇගේ හද පත්ලෙන් ගලන වේදනාව ඇස් අගින් රූරා වැටෙන සැටි දැක්කාය. ඇය කුඩා කාලයේ සිටම තමන් ආදරෙන් රැක බලාගත් මල් පන්තිවල මල් බැලීමට ඒවා රසවිඳීමට ගේ මිදුලට බැස්සාය. බැස යන හිරු රශ්මියට බොහෝ කාලයක් නිරාවරණය වූ නිසා වියළී ගිය කොළ දෙස ඈ බලා උන්නාය. ඒ හිරු රශ්මියෙන් තමාව එදා සිට අද දක්වාම රැක ගනිමින් සිටිනා සල්ගස අරුණෝදයට හිරු කිරණ විදිමින්, මද්දහනට පිච්චෙමින්, හවසට වෙහෙසකර ව කිසිදු නෝක්කාඩුවකින් බලා සිටිනා ආකාරය පිළිබඳ සිතුවාය.

නව යොවුන් වියේදී සාභාගී වූ ප්‍රිය සම්භාෂනයේදී 'ඩස්කි රෝසස්' පිළිබඳ උපන් උන්මාදය ඇගේ සිත තුළ තාමත් තිබෙන ආකාරය ගැන සිතුවාය. වත්තේ හැම තැනම මිලට ගත් ඩස්කි රෝසස් වගා කෙරුවද සරුසාරව වැඩුණේ සල්ගස ලඟ පාත්තිය පමණි. ඇ කිසි දිනක ඩස්කි රෝසස් නටුවෙන් ගලවා ගත්තේ නැත. තම කුඩා සොහොයුරියන් ඒවා කඩා සුවඳ බලන විට, පෝච්චි වලට දමන විට ඇ එය නොඉවසුවාය.

"මල් තියෙන්න ඕනේ පඳුරු වල"

"සුවඳ බලන්න, ලස්සනට තියන්න බැරි මලකින් මොනවැඩක්ද?" මීනුකා තර්ක කළාය.

"මල් තියෙන්නේ මලේ පැවැත්මට මිනිස්සු හිතාගෙන හිටියට හැමදෙයක්ම තියෙන්නේ මිනිස්සුන්ගෙ පැවැත්මට කියලා. අපි තේරුම්ගන්න ඕනෙ අපි අයිතිකාරයේ නෙමෙයි ආගන්තුකයො කියලා."ස්වේතා කීවාය.

"විකාර" මීනුකා ඇගේ මතයේම සිටියාය.

මීනුකා හා ස්වේතාගේ මල් කැඩීමට යන ආරවුල දිගු කාලයක් පැවතිණි. නමුත් මීනුකා මල් කැඩීම නතර කළේද නැත. ස්වේතා ඉන් හෙම්බත්ව එය ඉවසීමට හුරු වූවාය. නමුත් අවුරුද්දක සිට මීනුකා ද මල්වලට නිදහසේ නටුව සමඟ පෙම් කෙළින්නට අවස්ථාවක් ලබා දුන්නාය.

"වෙඩිං එකට ෆ්ලවර් ඩෙකරේෂන්ස් වලට මල් ගන්න කොට බොකේ එකට විතරක් ඩස්කි රෝසස් ගන්න. හැබැයි ඉතිං අනෙක් හැම තැනටම ඩස්කි රෝසස් දාන්න තියාගන්න එපා." තම වැඩිමහල් දියණිය ඩස්කි රෝසස් පිළිබඳ උපන් උන්මාදය ගැන දන්නා කවිතා කීවාය.

"අපි ලිලැක් දාමු. ලැවෙන්ඩර් එක්ක"

"ලිලැක්? ඊට වඩා ලස්සන මල් කොච්චර තියෙනවද? මීනුකා පුදුමයෙන් කීවාය.

"ඒවා මට ලස්සනයි. ඔයාලා ඒවට අකමැති නම් ඩස්කි රෝසස්ම දාමු" ස්වේතා ඇසක් ඉගිමරමින් කීවාය.

"ආහ්! නෑ. අපි ලැවෙන්ඩර්, ලිලැක්ම දාමු" තිදෙනාම එකවර සිනාසුණහ.

"අක්කා" සාවිත්‍රිගේ හඬ ස්වේතා ගිලී සිටි සිතිවිලි සයුරේ ඇව ගිලෙන්නට පෙර ගොඩගන්නට සමත්විය.

"ආහ්" ස්වේතා බංකුව පෙන්නමින් ඈ ළඟට විත් වාඩිවෙන්නට සාවිත්‍රි සංඥා කළාය.

"ඔයාගේ යාළුවා ආනියා ආවේ නැනේ" ස්වේතා ඇසුවාය.

"මේ දවස් ටිකේ ගෙදර සිටුවේෂන් එක හොඳ නැනේ. මං එයාට එන්න එපා කිව්වා" ඇගේ හඬ විඩාබරය. තම පියා පිළිබඳ බියත් සමාජය විසින් සෑදූ බැම්වල වැදී එහි ගල් පරළු වැදී සීරුණු ඇගේ හිතත් ඒ විඩාබර බවේ නොපෙනෙන පැත්තක හොල්මන් කරන බව ස්වේතා දැන උන්නාය.

"ඇයි මේ?" ස්වේතා ඇගේ උරහිස වඩා අත යැව්වාය. "ඔයා එයාට එන්න කියන්න හෙට. දැන් අපිට ප්‍රශ්නයක් නෑ. තාත්තා මුකුත් ලියන්නෙත් නෑ. ඊට පස්සේ තර්ජනය කරලා කෝල් ආවෙත් නෑ. එයාට එන්න කියන්න. ඔයාගෙ ස්කූල් වෑන් එකේ එක්කගෙන එන්න. අපි එයාට හොඳ කෑමක් හදල දෙමු. එයා දෙමළද?"

"නෑ"

"ආහ්! එහෙනම් අපි එයාට පේපර් තෝසේ හදලා දෙමු. එයා කැමති වෙයිද?"

"අපෝ ඔව්. මං ඉන්ටවල් එකට ගෙනියන තෝසේ අපි ෂෙයා කරගන්නවා.. එයා ගේන බටර් නාන් මට දෙනවා." සාවිත්‍රිගේ මුහුණ දිලිසෙන බවක් ස්වේතා දුටුවාය.

ස්වේතා ඒ සතුටෙන් තවත් ප්‍රමෝදයට පත්විය. ජීවිතය නම් අරුම පුදුම නවාතැනේ විටෙක සියලුම දුක් අමතක කර සිනාසෙන්නටත්, සියලුම සතුටවල් අමතක කොට හැඬීමටත් සියලුම සෝෂා අමතක කර සමාධිගත වීමටත්, සියලු භාවනාවන් අමතක කොට තම මනස තුළම සෝෂාකාරී වීමට ජීවිතය උගන්වන හැටි අත්වින්දාය.

"මම එන්න කියන්නම්" සාවිත්‍රි ගෙට දිව ගියේ සියලුම දුක් අමතක කරය.

# 6

මේලාට හා මානෙල් කතා කිරීමට ඉස්පාසුවක් ලැබුණේ බොහෝ කාලයකට පසුවය. සතියක පමණ අතිකාල සේවාව නිසා කාර්යබහුලව සිටි ඔවුහු අද දවස වික්ටෝරියා අවන්හලට ගොඩවී කෝපි කෝප්පයක රස විඳීමට තීරණය කළහ. වික්ටෝරියා අවන්හලේ ස්ටාර්බක්ස් කෝපි කෝප්පය දිව්‍යමය රසයක් ඇති එකක් යැයි මානෙල්ට එවර සිතෙන්නට විය.

"හැමදාම ඕටී කලොත් ස්ටාර්බක්ස් හැමදාම බොන්න පුළුවන්. හැමදාම ඕටී කළොත් සටාර්බක්ස් බොන්න වෙලාවක් නෑ." වික්ටෝරියා අන්හලේ මේලාට මුහුණ පා වාඩි වී සිටි මානෙල් ඇට අසෙන නොඇසෙන සේ කීවාය.

එයට ලා සිනාවක් පෑ මේලා තමා අතැති සටාර්බක්ස් කෝප්පය දෙස බැලුවාය. ඈ පළමු වරට ඒ පිළිබඳ ඇසුවේ තමාගේ ඇමරිකවේ පදිංචි ඥාති සොහෙයුරාගෙනි. එහි රස ගැන ඇයට ඔහු කියා දුන්නේය. වරක් ඇගෙන් මෙවන් ඈ කවදහරි දවසක බලන්නට කැමති රට ගැන ඇසුවේය. තම රටෙන් පිටට ගිය විට හුස්ම හිරවෙනවාක් මෙන් ඇට දැනුන නමුත් හුස්ම හිරකරගෙන හෝ ස්ටාර්බක්ස් කෝපි කෝප්පයක් රස විඳීමට ඇමරිකාවට යා යුතුයි යැයි සත් හැවිරිදි වියේදී මෙවන්ට පැවසුවාය.

ලෝක විශ්ව ගම්මානයක් වී ඇතැයි ඈ තවමත් විශ්වාස නොකළාය. ශ්‍රී ලංකාව තුළ හැදී වැඩුණු ඇගේ සිතුම් පැතුම් තම

බාප්පාගේ පුතුගෙන් සම්පූර්ණයෙන් වෙනස් බව ඈ දැන උන්නාය. ඇගේ බලාපොරොත්තුද එලෙසමය. එකම පරම්පරාවකින් පැවත ආවත් ඔවුනොවුන් මේ වෙනසට හේතුවූ කරුණු මේ කොදෙව්වෙන් එපිට සහ ඇතුළත ජීවිතවල වෙනසය. තම බාප්පාගේ පුතා හැදුනේ ඇමෙරිකාවේ නිසා කිසිදු දිනෙක ඔවුන්ගේ හදවත් සමපාත නොවීය. ඇමෙරිකාවේ ගැහැණුන්ට වඩා වෙනස් ස්පාඤ්ඤ ගැහැනුන්ද, ඊට වෙනස් පිලිපීන ගැහැනුන්ද හැමෝටම වඩා වෙනස් ප්‍රංශ ගැහැනුන් ගැනද ඈ දැන සිටියාය. ඒ නිසා තවමත් ලෝකය එකක් යැයි ඈ විශ්වාස නොකළාය. එමනිසා කුමන හෝ තත්පරයකදී ලංකාව ඇමරිකාව සමඟ සංසන්දනය කිරීම තරම් අප්‍රසන්න කතාබහක් ඈ අසා තිබුණේම නැත.

"ලෝකෙම මිනිස්සු එක්කෙනෙක් ඔක්කොම මනුස්ස වර්ගෙ කියලා හිතන්න කලින් අපිට පුළුවන් උනාද එහා වැටේ මිනිස්සු එක්ක තාප්පයක් නොගහා සාමයෙන් ඉන්න?" ඈ මෙවන් සමඟ තර්ක කළාය.

නමුත් ඈ ඉදිරියේ ඇති මේ ස්ටාර්බක්ස් කෝප්පය ඇට එක දෙයක් කියා පාන්නට විය. තමාට අවශ්‍ය දේ ලබාගත හැකි, ඒ ළඟා කරගැනීම සඳහා පාර සොයන්නන්ගේ ලෝකයක් දැන් නිර්මාණය වී ඇති බව දැන උන්නාය.

ස්ටාර්බක්ස් කෝප්පය හා මේලා අතර මතකාවර්ජන වලට බාධා කරමින් කතාව මානෙල් ඇරඹුවාය.

"මල්කාන්තිට ඔෆිස් එකේ කියන්නේ මල්කි කියලනෙ. මල්කාන්ති කිව්වම තරහ යන නිසා මල්කාන්තිගෙ ණම පරණවිතාන ඒ වුණාට අම්මගෙ වාසගම බර්තෝමියුලස්ලු එයා ඒකලු මල්කි බර්තෝමියුලස් කියලා යූස් කරන්නේ." මානෙල් කට කොනින් සිනා සෙමින් කීවාය.

"පරණවිතාන කියන්නෙ හොඳ සර්නේම් එකක්නේ. ඇයි ඒක පාවිච්චි නොකරන්නේ?" මේලා පුදුමයෙන් ඇසුවාය.

"පොෂ් වෙන්නනේ"මානෙල් කට කොනින් සිනාසුණාය."

සමහර මිනිස්සු උසස් කුලයක කියල පෙන්නන්න වාසගම් මාරු කරනවා. තව සමහරු හොඳ කසාදයක් කරගන්න, තව අය

හැංගිලා ඉන්න, ඒ අතර පොෂ් වෙන්න හිතාගෙනත් නම් මාරු කරනවා. අපිටත් විකාර අනුන්ගෙ ඒවම කියවනවා" මේලා කතා කළේ කළකිරීමෙන්

"මේකනෙ මේලා, ඔයයි මායි 8-5 ජොබ් කරන අය. අපි දෙන්නගේ යාළුකම රැඳිලා තියෙන්නේ කියවන්න ඕපදූපයක් හරි තියෙන නිසා. 8ට වැඩට එන්න කලින් නැගිටලා වැඩකරල එනකොට උදේට ප්‍රවෘත්ති බලන්න විදියක් නෑ. හවසට ගෙදර ගියාම ළමයින්ගේ වැඩයි ඔක්කොම එක්ක පොතක් පත්තරයක් කියවන්න වෙලාවක් නෑ. නිදහසක් ලැබුණමයි කියන්නකෝ ඒවා කියවලා රසවිඳලා සාකච්ඡා කරන්න තරම් හිතේ නිවනක් නෑ. තව රටේ දේශපාලනය කතා කරලා අපි අනාගතේ වෙනස් කරන්න සමාජ ව්‍යාපාර කරන්න කියලද? ඊට වඩා හොඳයි කාගේ හරි දෙයක් කතා කරලා හිනා වෙන එක" මානෙල්ගේ පැහැදිලි කිරීමේ තිබුණේ නෝක්කාඩු ස්වරූපයක් ද කළකිරීමක්දැයි සොයා ගැනීමට මේලා නොවෙහෙසුණාය.

මානෙල් ඒ කතාව කීවේ තමා මානෙල්ව අපහසුතාවයට පත් කළ නිසා ඊට නිදහසට කරුනු කීමක් ලෙස සිතුවාය. බොහෝවිට මිනිස්සු එහෙමය. තමා කරනා දේ සාධාරණීකරණය කිරීමට ඕනෑතරම් සාධක තිබ්බත් අනුන්ගේ ක්‍රියා දෙස සානුකම්පිතව බැලීමට අවශ්‍යතාවයක් නැතිතරම්ය.

ඈ හැඟීමකින් තොරව බලා සිටියාය.

"එක්ස්කියුස් මී" පිටතින් පැමිණි පිරිමි කටහඬට ඈ ගැස්සී ඒ දෙස බලන්නට විය.

"අනේ! අනුත්තර" මේලා ඈ උන් අසුනෙන් නැගිට්ටාය.

ඔවුනොවුන් අතට අත දී ආචාර කරගන්නා ආකාරය මානෙල් බලා සිටියාය.

"වාඩිවෙන්න" කෝපි කෝප්පයක් අතැතිව සිටි අනුත්තරට ඈ තමා ළඟ තිබූ ආසනයට අත දික් කළාය.

"අනූ, මේ ඉන්නේ මානෙල්. මානෙල් මේ අනුත්තර මගේ කැම්පස් එකේ යාළුවෙක්. එතකොට අනූ මානෙල් කියන්නේ මගේ ඔෆිස් එකේ කෙනෙක්" මේලා හඳුන්වාදුණි.

"ඔයා K L ට්‍රේඩස් එකේ නේ වැඩ කරන්නේ?" අනුත්තර මේලාගෙන් ඇසුවේය.

"ආ! ඔයා දන්නවා!" මේලා සිනාසෙමින් ඇසුවාය.

"මට මෙවන්ව හම්බඋනා ළඟදී. මං ගියා එයාලගේ බොස් එක්ක ඉන්ටර්විව් එකකට. එයා එතකොට කිව්වේ".ඔහු තම දුරකථනය මේසය මත තබා කෝපි උගුරක රස විඳිමින් කීවේය.

"මට මල්ලි කිව්වෙවත් නෑ" ඇය නෝක්කාඩු කීවාය.

"ඔයා fbවත් නෑ"

"අනේ නෑ. ඔයා මොනවද දැන් කරන්නේ?" ඈ ඇගේ අසුනේ ඇන්දට බර වෙමින් ඇසුවාය.

"මම තාත්තගේ බිස්නස්වලට උදව් කරනවා. තව හෙට රට පත්තරේට ලියනවා. කතෘ අඥාතයි ලිපි මාලාව මගේ"

"කතෘ අඥාතයි? අර සටහන යටින් අඥාතයි කියල ලියන එකද?" ඇගේ ඇස්වල දීප්තියක් තිබිණ.

"ඔව්" ඔහු සිනාසුණි. පළල් උරහිස් ගැස්සෙමින් ඔහුගේ මුතු කොණ්ඩය සෙලවෙන ලෙස සිණාසුණේය.

"මං කියවල නෑ. මල්ලි කියවනව දැකලා තියෙනවා" ඈ තමාගේ ස්වරය පාලනය කළ ආකාරය පිළිබඳ සැලකිල්ලෙන් හෙමින් කතා කළාය.

මේලා මේ කතාවට මෙතෙක් වෙලා නිහඬව සිටි මානෙල්ව එක්කරගැනීමට පොටක් සාදා ගත්තාය.

"අපිට කොහෙන්ද කියවන්න වෙලාවක්. නේද මානෙල්?" ඔවුන් දෙදෙනාම එකවර සිනාසුණේ සැහැල්ලුවෙනි.

"අවශ්‍යතාවයක් තියෙනවා නම් වෙලාව හදාගන්න පුළුවන්. අවශ්‍ය කැමැත්ත විතරයි. සබන් විකුණන්න හදන ටෙලිනාට්‍ය නොබලා මේවගේ දෙයක්වත් කියවලා බැලුවා නම් ළමෙක්ටවත් කියලා දෙන්න දැනුවත් වෙන්න තිබ්බා" අනුත්තර තම මාධ්‍යවේදී භූමිකාව නියෝජනය කළේය.

"ඔය කියන තරම් ඒක ලේසි නෑ." මානෙල් කීවාය.

"නොකා නොබී කන්න හොයන එකේ ඇති වැඩේ මොකක්ද? කන්න බොන්න හොයන්න රස්සාවක් කරනවා. හැබැයි රස්සාව ඇතුළේ කන්න බොන්න වෙලාවක් නෑ. ජීවත් වෙන්නෙ නැතිව ජීවත් වෙන්න ගොඩගහගන්න හදනවා. කලාවක් අමතර දැනුමක් දැක්කම ඇස් පියාගන්නවා" ඔහු කීවේ සිනා සෙමිනි.

"මම නම් රස්සාවක් කරන්නේ මූලික අවශ්‍යතා ඉටු කරගන්න. නැතුව අනාගතේට ගොඩගහගන්න නෙමෙයි". මානෙල් ඔහුගේ සියලු බර වචන වලට අතිශය යථාර්ථවාදී පිළිතුරක් ලබා දුන්නාය.

ඉන් ඉදිරියට අනුත්තර හා මානෙල් තර්ක කළ ආකාරය මේලා බලා සිටියා පමණි. මානෙල්ගේ අතිශය යථාර්ථවාදී හා අව්‍යාජ කථා එතරම් මිහිරි නොවුණත් ඇය ඒවායේ තිබූ ගැඹුරු ආර්ජිකමය ගැටළු දුටුවාය. නමුත් සියලු සැප සම්පත් ඇතිව ඉපදුණු දන්නා කාලයක සිට සුව පහසු දිවියක් ගත කළ අනුත්තර අනුන් ගැනද මේ සමාජය ගැනද දරන මානව හිතවාදී මතවාද අතිශය ප්‍රායෝගික නොවුණත් ඈ ඒවාට ද ප්‍රිය කළාය.

"ඔයා කියන දේවල් ප්‍රැක්ටිකල් නෑ අනු" මේලා තමාගේ දිගු නිහැඬියාව බින්දාය."

"හඳට යන්න මුලින් හීන දැකපු මිනිහා ඒ ගැන කියද්දී ඒ මිනිහටත් ඔහොම කියන්නැති අපි රියැලිටි එක කියල හිතන් ඉන්න ඉන්න එකට වඩා වෙනස් රියැලිටි එකක් ඕන මිනිස්සු මුලින්ම එක හීනයක් විදිහට පටන් ගන්නවා. ඒ හීන දකින මිනිහා ප්‍රැක්ටිකල් නැති කතා කියන මෝඩ දාර්ශනිකයෙක් කියලා දකින එක එදත් තිබ්බා. අදත් තියෙනවා. හෙටත් තියේවි. හැබැයි ඒ මෝඩ දාර්ශනික හීන මුළු ලෝකයේම ලොකු පිම්මක් වේවි"

ඔහුගේ වචනවල තිබූ විශ්වාසයට මේලා ඇලුම් කළාය. නමුත් මානෙල්ට එය හංදියේ කඩයක දේශපාලන අවනඩුවක් පමණක්ම විය.

දීර්ඝ සාකච්ඡාවකින් අවසන ඔවුන් එතැනින් පිටව යාමට නැගී සිටියහ.

"මේලා දැන් ලියන්නේ නැද්ද? ඉස්සර වගේ" අනුත්තර දයාබර සිනාවක් පාමින් ඇසුවේය.

"නෑ" ඈ කෙටියෙන් පිළිතුරු දුන්නාය.

"අපේ ලිපි මාලාවට මේ දවස්වල කෙනෙක් හොයනවා. මම රෙකමන්ඩ් කළොත්....."

"අනේ බෑ" ඇය තම අත් බෑගය අතට ගත්තාය."මේක පොඩි ළමයින්ගේ මානසික සෞඛ්‍ය ගැන ඩොක්ටර්ස්ලා එක්ක කරන ලිපි පෙළක්. මේ මගේ නම්බර් එක. ඔයා හිතලා ආන්සර් එකක් දෙන්න." ඔහු ඇගේ හිතේ කොණක වූ කැමැත්තේ සේයා දුටුවේය.

# 7

"ශිෂ්ටාචාරයේ දවසක වළනාපු තැන්වලින් හටගත් පැළවල හැදී  වැඩුණාලු එල ඒවා ප්‍රේමයේ එල. ප්‍රේමයේ එල අනුභව කොට මිදියුෂ දැමූ කුසලානයක - රස බැලුවාලු සැමදින. එයින් මත්ව වසන්තය අග - නිද්‍රාවට පත්ව සිටිනා ප්‍රේමණීය ආත්මයන් අවදි කරගත නොහැකිව ප්‍රේමය කලියුගයක."

පොළොව සිප වැළඳගනු නොහැකිව බලා සිටි සඳක්

''අමාවකට සඳ කොහේ යනවාදැයි නොඅසනු ඇත. මල් කෙමි ගිලිහී ගිය මලක් සුළඟට ගහගෙන නොයා ළඟ ඉන්න මල් කෙමි වලින් ඉල්ලන මලක් අමාවක අඳුරට සාප නොකරනු ඇත. එය ප්‍රේමයේම සලකුණක්"

"අක්කා මේ ඉන්නේ ආනියා" සාවිත්‍රිගේ කටහඬ අඩනින්දක සිටි ස්වේතාව ඇහැරවන්නටද පාසල් නොගොස් ගෙදර සෝෆාවක වැතිරී කවි ලියූ මීනුකාවද තිගස්සන්නට සමත් විය.

"ආහ්! ආනියා ඔය දෙන්නා වොෂ් එකක් දා ගෙන එන්න. අම්මා කුස්සියේ ඇති." ස්වේතා පැවසුවේ මෘදු ස්වරයකිනි.

වැනිලා පාට සමක්  උසට සරිලන මහතකින් හා ළැම හරහා පහලට වැටී තිබුණු ලා දුඹුරු පාටට හුරු කොණ්ඩයත් සහිත ආනියා දෙස මීනුකා බලා සිටියාය. ඇගේ ප්‍රිය මනාප රූපය මීනුකාට ආගන්තුක විය.

"එයා මුස්ලිම්ද?" මීනුකා ඇසුවේ ආනියා හා සාවිත්‍රි එතනින් පිටව ගිය පසුය.

"දන්නෑ" ස්වේතා අවුල් වුණු තම කොණ්ඩය සකසමින් වැතිර උන් තැනින් නැගිට්ටාය.

නාන කාමර තුනකින් සමන්විත මේ නිවසේ ආනියාට හිමි වුණේ ආගන්තුකයන්ගේ නාන නාමරයයි. ඉන් එළියට ආ ඈ ඇඳ සිටි ගවුම ඇගේ වයසට වඩා පෙනුමක් ගෙන දුන් වග මීනුකා සිතුවාය.

"දුව අම්මට හවසට එන්න කිව්වද? අපි ගිහින් දාන්නද?" කවිතා ආනියාගෙන් ඇසුවාය.

"එයාලගෙ අම්මලා එයි."

එසැණින් නාන කාමරේ සිට එළියට පැමිණි සාවිත්‍රි ආනියාට කතා කිරීමට ඉඩ නොදීම පිළිතුරු දුන්නාය.

"ආහ්!  එන්න ආනියා වාඩිවෙන්න" ස්වේතා ඈ වෙනුවෙන් කෑම මේසයේ පුටුවක් ඇද දුන්නාය.

සියලු දෙනාම ආහාරගත්හ.

"මං කැමතියි පේපර් තෝසේ කන්න. අපේ ගෙදර කුබුස්, නාන් හැමදෙයක්ම හදනවා. ඒත් මමී දන්නේ නෑ තෝසේ හදන්න"ආනියාගේ කටහඬේ වූයේ කෙළිලොල් බවකි.

"ආනියා මුස්ලිම්ද?" මීනුකා ප්‍රශ්න කළාය.

"නෑ මගේ ඩැඩී කතෝලික කැනේඩියන්. මමී නම් රෂියන්. ඒත් එයාලගේ මුත්තලා ඇවිත් තියෙනවා එයාලා අරන් ලංකාවට මගේ ඩැඩීගේ මුත්තත් එහෙමයි. ගොඩ කාලෙකට කලින් ලංකාවට ඇවිත්. මට ලංකාවේ ලේ නෑ. ඒත් පුරවැසි භාවය තියෙනවා. මං ඉපදුනේ මෙහේ" ඇගේ සිතේ තිබූ සැහැල්ලු බව ඇගේ ආත්මීය නිදහස පෙන්නුම් කළ වග මීනුකා සිතුවාය.

"ඔයා අදහන ආගම මොකක්ද?" කවිතා ප්‍රශ්න කළාය.

"මට ඩැඩී කියන්නේ මං කැමති ආගමක් අදහන්න කියලා මං ඉස්කෝලේ ඉගෙනගන්නේ බුද්ධාගම. ගොඩක් දේවල් නොතේරුණත් මං කැමතියි බුද්ධාගමට" ඇගේ සිංහල හැසිරවීමේ කිසිඳු වෙනසක් නොවිණි.

"බුද්ධ දර්ශනයේ මොනවටද කැමති?" ස්වේතා ඇසුවාය.

"නිදහසට, මිනිස්සුන්ට හිතන්න, ප්‍රශ්න කරන්න දීලා තියෙන නිදහසට එතකොට ඒකේ එන සංසාරය වගේ ඩීප් කන්සෙප්ට් වලට" ආනියාගේ හිසේ පිට දෙපතුලම දක්වා තමාටද සොහොයුරියන්ටද ඉගෙනීමට බොහෝ දේවල් ඇති බවත් ස්වේතා සිතුවාය. නමුත් එය අවුරුදු පහළොවක ජීවිතයේ ඇගේ නොදැනුවත්කමේ සැහැල්ලුව දැයි ස්වේතා සැක කළාය.

"ඔයා ලංකාවට ආදරෙයිද? මීනුකා ඇසුවාය.

"ලංකාවට ආදරේ කරන්න පුළුවන් ලංකාවේ ලේ තියෙන අයට විතරද? එස් මහින්ද හාමුදුරුවෝ ඉන්දියාවේ බෝඩරේක සිතලේ ඉඳල ඇවිත් මේ කාශ්ටක අව්වට ආදරේ කළා. එතකොට ඔහේ අනාථ වෙච්ච කෙනෙක් තමයි දස්කොන් මහ මුදලිතුමා. අම්මගේ රට මව්රට, ඉපදුණු රට ජාත භූමිය, ලේ පැවත එන රට ජාන භූමිය. ඔය ටික එක එක තැන්වල තිබ්බත් මං හැදෙන්නේ මේ රටේ. මං මේ රටට ආදරෙයි " ඈ ජයග්‍රාහී බැල්මක් හෙලමින් කීවාය.

තම ජීවිත කාලය පුරාවට තමාට තමා වීමට අවශ්‍ය වූ සැහැල්ලු විවෘත මනසක් ඇති තරුණියට හදිසියේ නිවසට කඩා පැන වචන විසිරවීම මීනුකාගේ හිතට වැදුණි. තමා 'තමා' වීමට සිටි කෙනා නොවීමට හැකි වූ තැනක වෙන කෙනෙක් තමන්ගෙන් තමා බලාපොරොත්තු වූ කෙනා වී සිටිනු දැකීම. මෙතරම් තමාව අපහසුතාවයට පත් කරාවි යැයි කිසි දිනක නොසිතුවාය.

ආනියාගේ සොඳුරු මුහුණත් වහසට වඩා මුහුකුරා ගිය ශරීරය හා ලා දුඹුරු පැහැති කොණ්ඩය ඇගේ රුසියානු සම්භවය කියා පාන්නට විය. නමුත් ඈ කතා කළේ ප්‍රංශ ගැහැනියක් මෙන් නිදහසෙනි. ඇගේ හැසිරීම සාම්ප්‍රදායික යුරෝපීය තරුණියන් මෙන් විය. තවත් විටෙක ඇගේ මුහුණ දැත් පුපුරා යයි යැයි සිතෙනා තලත්තෑණි ආසියාතික ගැහැනියක මෙන් විය.ප්‍රශ්න හුඟකට පිළිතුරු ගෙනා ඇගේ ආගමනය තවත් සොඳුරු ඉසව්වකට තම ජීවිතය ගෙන යන්නට සූදානම් වෙන වගක් ස්වේතාට දැනිණ.

"ආනියා හරිම නිදහසේ ජීවත් වෙනවා. සාවිත්‍රිටත් උගන්නන්න එහෙම ඉන්න" ස්වේතා කෑම මේසයෙන් නැගිට්ටාය.

සාවිත්‍රි ඒ කියූ විගස ආනියා දෙස බලා සොඳුරු හිනාවකින් සංග්‍රහ කළාය.

☆☆☆☆☆☆☆☆

හදිසියේ තමා වෙත පැමිණි අවස්ථාව මගහැරීමට මේලාට නොහැකි විය. නමුත් තීරණය අතීරණය මත වැණුනු ඈ අමතර රැකියාවක් ලෙස සති අන්ත පුවත් පතේ ලිපියක් ලිවීම ලඟා කරගැනීම පුල පුලා බලා සිටි සිහිනයක්, කාලය විසින් අතැර දැමූ නිසා කාලය තමා වෙත නැවත ගෙන ආ අවස්ථාවක් ලෙස සිතුවාය. තම සිතුවිල්ල නැවත වෙනස් වීමට පෙර ඈ අනුත්තරට කතා කළාය. ඒ සඳහා කැමැත්ත ප්‍රකාශ කළ පසු ඈ තමාගේ ශරීරය තුළ ලේ ගමනාගමන වේගය වෙනස් වූ ආකාරය වින්දාය. ඒ සතුටට අසල තිබූ කොට්ටය වැළඳගෙන සිනාසුනේ කුඩා දරුවෙකු ලෙසය.

ඒ සඳහා කටයුතු සූදානම් කරගැනීමට හෙට පත්තර කන්තෝරුවට යා යුතු වග තම ස්වාමි පුරුෂයාටද දෙමව්පියන්ටද සොහොයුරා ද කීවේ උතුරා ගිය සතුටකිනි.

සිහිනයක් නැවත ගොඩනැගිය නොහැකි ලෙසම බිමට සමතලාව තිබුණත් නැවත ගොඩනැගිය හැකි වගක් සිතට දැනෙන්නට විය.

ඈ තම පොත් කාමරයට ගොස් එහි දූවිලි පිස දමා සැකසුවාය. මේසය මත මල් පෝච්චියක් තබා අස්පස් කළාය. බොහෝ කාලයකට පෙර තමාගේ මිතුරියක් තමාට තෑගි කළ කෘත්‍රිම පතොක් ගස ඈ දුටුවාය.

"කවුරු මොනවා කීවත්- ගහක් කොළක් නැති බිමක මුල් ගැඹුරටම විදහාගෙන හෙමින් ඉකිබිඳ ඒ දුක විස කොට කටුවලට එව්වලු පතොක්! "

මිතුරිය එදා කියූ වචන පෙළ තවමත් ඈට මතකය.

ඈ ජීවිතය සුවයහනක් නොවන බව දැන උන්නාය. රෝසමල් තෑගි කරන්නවුන්ට වඩා පතොක් පැළ තෑගි කරන්නවුන්ට ඈ කැමති වූයේ ඒ නිසයි.

"අකල්හි මියගිය නොකල්හි මුණගැහෙන ජීවිතයට අල්ලා බැඳ ඇණ ගැසූ සිහිනයක් 'සිහින නොදැකපු උන්' විසින් ගල් ගසා මරා දමන ලදී. සබඳ ඒ හීන මියගිය සමයයි. දැන් එළඹ තිබෙන්නේ ඒ සිහින උත්ථානයේ ආශ්චර්යය පෑමට නියමිත සමයයි! " ඈ අසල තිබූ පොතක සටහන් කොට පෙනහැල්ල පිරෙන්නට ගත් හුස්ම පිටු සැලෙන සේ ප්‍රශ්වාස කළාය.

ඇය තම පියාගේ මිතුරෙක් සොයා දුන් වර්තමාන රැකියාවට යාමට පෙර නිදහස් මාධ්‍යවේදිනයක් වීමට සිහිනයක් ඇති බව කීවාය.එවක ඒ සිහිනයට ගල්ගසා මරා දැමූ, ඒවාට විලංගු දැමූ ඔවුන්ට එසේ කිරීමට අවශ්‍ය නැත. එසේ කිරීමට ඇය ඉඩදෙන්න ද සූදානම් වූයේ නැත.

☆☆☆☆☆☆☆☆

"යුසෙෆෝනා"...... මීනුකා තාලයට ශබ්ද කළාය . "මං හරි කැමතියි ඔයාගේ වාසගමට"

"ඒවගේ වාසගමක් තියාගෙන ජීවත් වෙන එක ලේසි නෑ." මාරියා සිනාසෙමින් පිළිතුරු දුන්නාය.

විසිත්ත කාමරයේ තැනින් තැන වාඩි වී සිටි ස්වේතා, මීනුකා හා සාවිත්‍රි සිටියේ ආනියා යුසෙෆෝනා නැමැති මේ සොඳුරු තරුණිය පිළිබඳ හදාරමිනි.

"මෙයාට ලස්සනට චිත්‍ර අඳින්න පුළුවන් අක්කා" සාවිත්‍රි කීවේ ආඩම්බරයෙනි.

"එහෙමද? මොන වගේ ඒවද?" ස්වේතා ප්‍රශ්න කළාය.

"ස්පිරිචුවල් ආර්ට්ස් කරනවා. මං ඕලෙවල් වලින් පස්සේ එක්සිබිෂන් එකක් කරන්න ඉන්නේ"

"මොනවද තියෙන තීම්ස්?" මීනුකා ඇසුවාය.

"මගේ හිතේ තියෙන තීම් එකට එක හේතුවක් තමයි සාවිත්‍රි" ඈ සාවිත්‍රි දෙස බලමින් කීවාය.

"මම? ඔයා මට කියලවත් නෑ" සාවිත්‍රි නෝක්කාඩු කීවාය. " මොකක්ද ඉතිං තේමාව?"

"ජීවිතය තුල සැඟවීම " ආනියා කීවේ එපමණකි.

"ඒ කිව්වේ?" මීනුකා දැඩි උනන්දුවෙන් ඇසුවාය.

"මිනිස්සු තමන්ව අපහසුතාවයට පත් නොකර ඉන්න කම්ෆෝට් සෝන් එකක් හදා ගන්නවා. එයාලා ඒක ඇතුළෙ හැංගිලා ඉන්නවා. එයාලා හිතනවා ඒ සුවපහසු කලාපේ එයාලා ආරක්ෂිතයි කියලා. යුද්ධය තුළ සිවිල් මිනිසුන්ගේ සැඟවීම, සිංහල සමාජය තුළ දෙමළ මිනිස්සුන්ගේ හැංගීම, ඉංග්‍රීසි පුළුවන් මිනිසුන් අතර ඉංග්‍රීසි බැරි මිනිස්සුන්ගේ හැංගීම, ධනවත් ළමයි අතර දුප්පත් ළමයින්ගේ හැංගීම තව පාස්කු ප්‍රහාරයෙන් පස්සේ ලංකාවේ හැංගිච්ච දේවල් වගේ."

"ඒක ඇතුළෙ කොහෙද මං මාතෘකාවක් වෙන්නේ ?" සාවිත්‍රිගේ මුහුණ පිරී තිබුණේ කුහුලෙනි

"ඔයා විතරක් නෙමෙයි. ඒක ඇතුළේ මමත් මාතෘකාවක්. ඔයාට හොඳට සින්දු කියන්න පුළුවන්. ඒත් ඔයා හිතනවා සිංහල සමාජය ඇතුළෙ ඔයාව ප්‍රතික්ෂේප වෙනව කියලා. ඉතිං ඔයා සමාජය ඇතුළේ හැංගිලා ඉන්නවා. ඔයාට ඍජු දෙමළ උරුවක් තියෙන කෙනෙක්. ඒත් මං වගේ අය, හරියටම කවුද? මොන ජාතියේද කියන්න බැරි නිසා හැංගෙනවා." ආනියා පැහැදිලි කළාය.

"ඇත්තටම  එක හොඳ මාතෘකාවක්" ස්වේතා ආනියාගේ අදහස් වලින් ප්‍රමෝදයට පත් විය.

"ඕවා චිත්‍රයට නගන එක ලේසි නෑ" මීනුකා කීවාය.

අනියා උපේක්ෂාවෙන් සිනාසිණි.

සාවිත්‍රි ආනියාගේ කියවීම් තුළ තමා සොයාගත්තාය. ඇගේ සැඟවීම සොයාගත්තාය. ආනියා මෙතරම් දැනුවත් යැයි සාවිත්‍රි දැනගත්තේ පළමු වරටය. ආනියා වෙනදාට කතා කළේ ඈ ගිය රටවල් ගැනය. ඇගේ සිහින ගැනය. ඈ ලියූ මේ පිටපත පළමු වරට සාවිත්‍රි අද කියෙව්වාය. ඒ තුළ තමාද චරිතයක් වී සිටි නිසා සතුටට පත් වුණාය.

"ඇත්තටම මේ සැඟවීම මිනිස්සු කතා කරන්න ඕන දෙයක්. අවාසනාවකට ඒ සැඟවීම ගැන කතා කරන්න දන්නේ අපි වගේ සැඟවෙච්ච අය. ඒත් ඉතිං අපි ඉන්නේ හැංගිලානේ" මීනුකා හැඟීමකින් තොරව කියගෙන ගියාය.

"ඇත්තටම ඔයා එහෙම නෑ. ඔයා කවි ලියනවා සමූළුවල කතා කරනවා. ඉස්කෝලෙ ඇතුළේ ඔයා විශේෂයි. සැඟවීමෙන් එළියට එන්න උත්සාහ කරන කෙනෙක්. ඔයා ඉස්කෝලෙන් එළියට ගියාමත් ඒ විදිහට සමාජගත වෙන එකයි කරන්න තියෙන්නේ". අනියා වගකිය යුතු කෙනෙක් මෙන් කීවාය.

ස්වේතා සිටියේ සැඟවීමටවත් කැපී පෙනීමටවත් ක්‍රියාකාරී වීමටවත් අවශ්‍ය නැති අභියෝගයට ලක් නොවන තැනක යැයි ස්වේතා සිතුවාය. ඇගේ ජීවිතේ පළමුවරට එවැනි සැඟවීමක් හා බියක් ඇති වූයේ මෙවන්ගේ පවුලට තමා ද්‍රවිඩ යැයි කීම කුමන ආකාරයේ ප්‍රශ්නයක් නිර්මාණය කරයි දැයි සිතු කාලයේ පමණි. නමුත් ඔවුන් ද එයට දැක්වූ ප්‍රතිචාරය නිසා ඇයට කෙදිනකවත් මතකයේ තබාගත යුතු තරම් සිත් තැවුලක් නොවීය.

"සමහර විට මේ සැඟවීම නිර්මාණ කරන්නේ අපේ හිත" කවිතාද කතාවට එක් වන්නට උත්සාහ ගත්තාය.

"ඒ වුණත් සැඟවීමට හේතු තියෙනවා. සිංහල මිනිස්සු කැමති රටේ ලොකු පුටුවල එයාලගෙ අයව දකින්න, දෙමළ අයට ඕනෙ එයාලගේ අය දකින්න මුස්ලිම් අය කැමති එයාලව දකින්න. ඔය හැම දේටම බය අපි වගේ අය කැමති හැංගෙන්න" ආනියා සිය අදහස් වචන කිරීමට හොඳ හැකියාවක් සහිත වූ ඇත්තියක බව කවිතා සිතුවේ ඒ පිළිතුර ඇසීමෙනි.

"මං කැමති හැම ලොකු පුටුවක මනුස්සකම් පිරුණු මිනිස්සු දකින්න" ස්වේතාගේ ඒ පිළිතුරින් ආනියා ස්වේතා පිළිබඳ පැහැදිලි රූපයක් මවා ගත්තාය.

"කොහොම උනත් හැමදේම ලස්සන මිශ්‍ර උනාම බුර්කාවෙන් මුහුණ වහපු ගැහැණියක්, ඇස්වහ නොවදින්න නළලට තිකල තියපු ගැහැණිය, වගේම නිදහසේ ඉන්න සිංහල ගැහැණිය එකතු වෙලා සමාජය ගොඩනගන්න හදන තැන ලස්සනයි" කවිතා කීවාය.

ආනියා නික්මුණු පසු මේ නිවැසියන්ට සිතීමට බොහෝ දේවල් තිබිණ. ඈ ගෙන ආ නැවුම් සිතිවිලි නිසා ඒ නිවස පිරී තිබිණ.

"ප්‍රාර්ථනා ඇමිණූ කොන්තයක් පපුවට තුරුළු කරගෙන ප්‍රේමය මිය ගිය තැන්වල, ලේ වැගුරුණු තැන්වල, යකඩින් ප්‍රශ්න විසඳූ තැන්වල ප්‍රේමය උත්ථානයේ සිහින ඇතිව සුන්දරත්වය වේලයෙන් වැසූ මරියාවන්ගේ දෑස පත්ලේ මිදුණු සීතල කඳුල ඇගේ හද පත්ලේ උපන් ප්‍රේමයේ උණුහුමෙන් වාෂ්ප කර හැරියලු. ස්වර්ගීය දොරටු තෝසා කඩයටත් ෆර්දාවටත් ඇර දුන්නු ප්‍රේම ගීතිකා!''

මීනුකා ඇගේ කවි පොතේ සටහන් කළාය.

බොහෝ කාලයකට පසු සුන්දර උදෑසනක ඩස්කි රෝසස් පඳුරු ඉරත් එක්ක දොඩමළු වන ආකාරය ස්වේතා දුටුවාය. මීනුකා හා සාවිත්‍රි දෙදෙනාම පාසල් යාමට සූදානම්ව සිටි නිසා ස්වේතා ද හර්ෂදේවන්ගේ කාරයේම තම විවාහයට අවශ්‍ය ඇඳුම් ආයිත්තම් වල වැඩකටයුතු වලට යෑමට සිතුවාය. ඇය ඇඳ සිටියේ යුරෝපීය ගවුමකි. එයට සරිලන පරිදි කොණ්ඩය කඩා එයට ගැළපෙන කරාබු යුගලක් පැළඳ සිටියාය. උරහිස් ඇර තිබූ ගවුමට උඩින් ඇ පැළඳ සිටි කුරුසය දිලිසෙන්නට විය. හදිස්සියේම කාංචිවරම් සාරියක් හැඳ එළියට ආ කවිතාව දැක සාවිත්‍රි පුදුම වූවාය.

"අම්මා කොහෙ යන්නද?"

"ඇයි ඔයා අකිනම්ව හම්බවෙන්න යනවා කිව්වේ, ඇඳුම් ගැන තව කතා කරගන්න දෙයක් තියෙනවා කියලා"

"මම අප්පගේ කාර් එකේ අප්පා එක්ක එතනින් බහින්නම්"

"අපි දෙන්නම මගේ කාර් එකේ යමු දරුවෝ. අප්පා ඩ්‍රයිවර් එක්ක නංගිල එක්කගෙන යයි"

"හොඳයි" ස්වේතා තර්ක නොකරම එකඟ වූවාය.

"මෙවන් අයියා එතනට එනව කිව්වද?" මීනුකා ඇසුවේ පාසලේ සපත්තු දමමිනි.

"ඔව් එයා එතනට එයි"

හර්ෂදේවන් මීනුකා හා සාවිත්‍රිව ගෙන රියදුරා සමඟ පිටව ගියේ ඔහුගේ වාහනයෙනි. කවිතා ස්වේතාට රියදුරු ආසනයේ වාඩි වී ගමනට සැහැල්ලුවෙන් එකතු වූවාය.

පාසලේ විවේක කාලයේදී ආනියා හා සාවිත්‍රි කතාවට වැටෙන්නට ඉඩක් ලැබුනි.

"අපේ අක්කලා හරි කැමතියි ඔයාට" සාවිත්‍රි කීවේ ආනියාගේ මුහුණ බලාගෙනය.

ටික වේලාවක් යනතුරු දෙදෙනා අතර තිබූ නිහැඬියාව සාවිත්‍රි බින්දාය.

"ඔයා දන්නවද? අපේ ලොකු අක්කා කසාද බඳින්නේ සිංහල කෙනෙක්ව" සාවිත්‍රි කීවාය.

"එහෙමද?" ආනිගේ ස්වරය ජීවයෙන් පිරුණු එකක් වග සාවිත්‍රි සිතුවාය.

"මං එයාට කිව්වා කසාදෙන් පස්සේ අයියගේ වාසගම පාවිච්චි කරන්න කියලා. එයා බස්නායක. මෙවන් බස්නායක"

"ස්වේතා බස්නායක. එතකොට නම් අක්කට ඕන තැනක බය නැතිව නම කියන්න පුළුවන්"

"අක්කා කියන්නේ එහෙම ඕනෙ නැලු. එයාගේ සර්නේම් එක කවදාවත් එයාට කරදරයක් වෙලා නැලු" සාවිත්‍රි කීවේ සිනාසෙමිනි.

"සමහරවිට ඔයාලගෙ අම්මා කියන්න වගේ මේ හැමදේම අපි හිතින් හදාගත්ත දේවල් වෙන්නත් පුළුවන්" සාවිත්‍රි සාවදානව වචන ගෙතුවාය.

"මම ගොඩක් කලුයි. එතකොට හැමෝම දන්නව මම දෙමළ කියලා. ඒත් අපි දන්න ඉතිහාසයට අනුව සිංහල අයත් ගොඩක් කලුයි. ඒත් දැන් එයාල එක එක පාටයි. දෙමළ අයත් එහෙම ඉන්නව. කෝම උනත් සමහර මිනිස්සුන්ට පුදුම හැකියාවක් තියෙනවා හමේ පාට බලලා ජාතිය කියන්න. ඇඳුම දිහා බලලා ආගම කියන්න" සාවිත්‍රි හෙමිහිට කීවේ කුබුස් රොටියක රස බලමිනි.

"ඕක ලංකාවේ විතරක් නෙමෙයි. ඇමරිකාවෙත් එකයි. හැම රටේම මිනිස්සු එහෙ ඉන්නවා. අපිට හැම සුදු මනුස්සයවම සුද්දෝ. ඒ වුණාට ඒ  අයට පුළුවන් පොලිෂ්, අයිරිෂ්, බ්‍රිටිෂ්, ෆ්‍රෙන්ච් කියලා ගාණට හදුනගන්න. ඒ මිනිස්සු සුදු හමත් කෑලිවලට බෙදනවා" ආනියා පැවසුවේ ලෝකෙ කොහේ උනත් එකයි කියන හැඟීමෙනි. එයින් ඈ ලද පීඩාව හා විඩාව දෑස් තුළ ගිලී තිබෙනු සාවිත්‍රි දුටුවාය.

☆☆☆☆☆☆☆☆

"ඔන්න දැන් ආයෙත් අකිනම් මීට් වෙන්න ඕන නෑ. ඇඳුම් වැඩයි ඩෙකරේෂන් ප්‍රශ්නයි ඉවරයි." කවිතා කොල්ලුපිටියේ ප්‍රසිද්ධ සාප්පු සංකීර්ණයක වාහන ගාලේ සිට පැවසුවාය.

"අම්මා දැන් ඔයාලා චර්ච් සෙරමනි එකේ වැඩ ලෑස්ති කරගන්න. අපි පෝරුව සෙරමනි ලෑස්ති කරලනේ තියෙන්නේ" මෙවන් කීවේ උතුරා යන සතුටකිනි.

"හරි මෙවන්. අපි ඒවා බලාගන්නම්, කරදර වෙන්න එපා. ළඟදී එන්නම්කෝ ඔයාලගෙ ගෙදර." කවිතා සිටියේ පැය හතරක් සාප්පුවට වී විඩාබර වූ මුහුණකිනි. ඇය ගොස් කාරය නැංගාය.

"ඔයා පරිස්සමින් යන්න එහෙනම්" ස්වේතා මෙවන් දෙස දයාව පිරුණු බැල්මන් හෙළුවාය.

"ටේක් කෙයා"

වාහන දෙකම ගාලෙන් පිටවිය.

# 8

"බලාපොරොත්තු කියන්නේ මහ පුදුම දෙයක් ජීවිතේ මොනතරම් කරදරවලින් පිරිල තිබුණත් තව මොහොතක් හරි හුස්ම යට ජීවිතය අයදින්නේ බලාපොරොත්තු. ජීවිතය ගැන හුඟක් බලාපොරොත්තු තියාගෙන අලුත් ජීවිතයක් පටන් ගන්න මනුස්සයෙක්ට එක එක හීනෙ දැවිලා හළු වෙලා ගියත් ඒ හළු වලින් පවා ඒ හීනය නැවත ගොඩනගන්න පුළුවන් කියල ඉතිහාසය අපිට ඉගැන්නුවා. තව මාස දෙකකින් එළඹෙන්නට නියමිත අලුත් ජීවිතය ගැන බලාපොරොත්තු වලට මං බයයි. ඒ බලාපොරොත්තු මගේ ඇස් ඉස්සරහම අළුවෙලා යයි කියල බය හිතේ තිබුණත් ඒ හළු වලින් පවා බලාපොරොත්තු නැවත ගොඩනගන්න හිතේ තියෙන ධෛර්යයට මං ආදරෙයි"

මධ්‍යම රාත්‍රියට ලං වී ඇතත් කිසිම නිදිමතක් නැති නිසා සටහන් පොත පසෙකින් තබා ස්වේතා විසිත්ත කාමරය පසු කර කුස්සිය දෙසට ඇදී යන්නට විය. ඒ අතර තුර හමුවන හර්ෂදේවන්ගේ අධ්‍යන කාමරය අහම්බෙන් ඇගේ නෙත ගැටුණේ එහි දොර විවෘත කර තිබූ නිසාය. සාමාන්‍යයෙන් එයි දොර විවෘත වී තිබෙන්නේ හර්ෂදේවන් එහි සිටිනා විට පමණි. පිටතට පෙනෙන ජනේලය හැර තිබුණත් එයින් ගලා ආ සඳ එළිය හැර වෙන කිසි එළියක් හෝ කිසිවෙක් ඈ නොදුටු නිසා ඈ කාමරයට ඇතුළු වී විදුලි පහන දැල්වූවාය. ඉන් ගලා ආ සීන් එළියට ඈ දුටුවේ දකුණුපස පොත් රාක්කයේ ලඟ බිම වාඩිවූ හර්ෂදේවන්වය.

"දුව බය උනාද?" ඔහු ඇසුවේය.

"නෑ අප්පා"

"එන්න. මෙහෙන් ඉඳගන්න."

ඇද ඔහු ළඟින් වාඩි වූවාය.

ඔහු ළඟතබා ගෙන සිටි පොත ඈ අතට ගත්තාය.

"කළුවරේ ලියන්නවත් කියවන්නවත් පුළුවන්ද?" ඈ ඇසුවාය.

"නෑ මම ලියලා, කියවලා ඉවර වෙලා කළුවරේ හිතුවා" ඔහු කීවේ තම දියණියගේ උරහිස වටා අත යවමිනි. "කළුවරේ ඉන්න එක පවා කොච්චර දේවල් අපිට උගන්නනවද?" ආලෝකයේ වටිනාකම, අඩ අඳුරේ කලාව, කළුවරේ තියෙන සමාධිය, බයංකාරකම"

"ජීවිත කාලෙම අඳුරේ හිටපු මිනිස්සු ආලෝකයට බයයි. ජීවිත කාලෙම ආලෝකයේ හිටපු අය අඳුරට බයයි" ස්වේතා කීවේ නිවුණු හඬකිනි.

"ඔයා කැමති කොයි විදිහටද?" ඈට ළංව සිටි හර්ෂදේවන්ට වුණේ ඈ කෙතරම් වැඩී ඇත්ද, ජීවිතය කෙතරම් ගෙවී ඇත්දැයි කියාය.

"මම කැමති උදේ වැටෙන අවු රැල්ලට දවල්ට එන පිච්චෙන අව්වට, හවසට රාස්සිගෙ අව්ව වැටුණම එන පීඩාවට, පුරහඳ එක්ක එන අඩ අඳුරට, අමාවකට එන ඝන අඳුරට" ඈ ඔහුගේ පපුව මතට හිස තබා ඔහුට ලංවූවාය.

"දුව ඔයා දන්නවද? පාරේ වැඩ කරන මනුස්සයා අරුණැල්ලට හුස්ම අරන්, මද්දහනේ පිච්චිලා රාස්සිගේ අව්ව වෙලාවට කීයක් හරි අරන් ගෙදර ගිහින් දරු පවුල් නඩත්තු කරනවා. ඒ දරුවෝ හඬෙන් ඉල්ලනවා ඇති තව රෑ දිගු වෙන්න කියලා. මහන්සි වෙලා වැඩ කරපු තාත්තට නිදාගන්න. උන් තව උදේකට බයයි බඩගිනි දැනෙයි කියලා" ඔහු තේරුම් කරන්නට උත්සාහ කළේය.

"මට තේරෙනවා අප්පා. මිනිස්සු ඒ ඒ දේවල් විඳින්නේ තමාට සාපේක්ෂව"

"ඔව් මං දුවට කීවේ එක පැතිකඩක්. බලෙන් කාමරයට කොටු කරපු ගෑනියෙක් ඉල්ලන්නේ ඒ රාත්‍රිය ඉක්මනින් ඉවර වෙන්න කියලා"

ඇ දෙනෙත් පියාගෙන අසා සිටියාය. මිනිසුන්ගේ ජීවන රිද්මය දන්නා ප්‍රේමණීය ආත්මයකට, මේ තරම් මනුස්සකම් පිරි මනුස්සයෙකුට දාව උපන් ඇ කෙතරම් භාග්‍යවන්ත දැයි සිතුවාය.

"ඒ මිනිස්සු වෙනුවෙන් අපිට පුළුවන් දේ අපි කරන්න ඕනේ. ඔයා දන්නවනේ මං වගකීමටත්, යුතුකමටත් එහාගිය දේවල් කරන්න නිතරම උත්සාහ ගන්නවා"

"මං දන්නවා අප්පා"

"මං අනාගත පරපුර ලෙඩ්ඩු කරන, අපේ රටේ අනාගතය උන්ගේ වර්තමානය වෙනුවෙන් ලාබෙට විකුණන මිනිස්සුන්ට විරුද්ධව කතා කළා. දුප්පත් මිනිස්සුන්ගේ සල්ලිවලින් දුවන රජයේ ඉස්පිරිතාලවලට එන මිනිස්සුන්ට බෙහෙත් රජයෙන් නොදී කොමිස් තියාගෙන ෆාමසිවලට ලියපු මිනිස්සුන්ට විරුද්ධව වැඩ කළා. ඒත් මේ සමාජ ක්‍රමය මාව අසරණ කරලා"

"අප්පා දුකෙන්ද?"

"නෑ. ඒත් කලකිරීමක් තියෙනවා. දේවල් දැක දැකත් අන්ධයෙක් විදියට, ගොළුවෙක් විදියට ඉන්න වෙච්ච එක ගැන"

"අප්පා හිතනව නම් ඔයා ආයෙම සටන් කරන්න ඕනෙ කියලා එහෙම කරන්න. පශ්චාත්තාපය, තමන්ට තමන් වැරදිකාරයෙක් කියලා හිතෙන එක ඔයා වගේ කෙනෙක්ට ගැළපෙන්නේ නෑ" ස්වේතා ඔහුගේ රැහැනින් මිදී පියාගේ දෙනෙත් දෙස බලමින් කීවාය.

"එහෙම කියල මට ඔයාව, මගේ පවුල අනතුරේ දාන්න බෑ. ඒත් තාප්පේ ඇතුළෙ හොඳ පරිසරයක් හදල දීලා පිට අය වගේ නොවී ඉන්න කියල ආත්මාර්ථකාමී ආදේශපාලනයක ගිලෙන්නත් බෑ."

"අප්ප ගන්න ඕන තීරණයක් හරියි කියල මම විශ්වාස කරනවා. මොකද මගේ අප්ප එහෙම කෙනෙක් එළියෙන් ඇතුළෙත් දෙකේම තියෙන්නෙ තමන්ගෙ ලේ කියලා හිතන කෙනෙක්. මනුස්සකම් පිරුණු කෙනෙක්"

ඇ තරම් ඔහුව තේරුම්ගත් තවත් කෙනෙක් නැතැයි හර්ෂ දැන සිටියේය. නිතර තමන් ඇටවත්, ඇ තමන්ටවත් සිද්ධ වුණ දේවල් කියමින් කතා නොකළත් ඔවුන් අතර තිබූ චිත්ත බන්ධනය

අභියෝග කළ නොහැකි තැනක තිබූ බව ඔවුහු දැන සිටියහ. මොනාලිසා බැලීමට ප්‍රංශයට ගිය අයෙක් බොනපාට්ගේ පිළිරුවට වශී වී එහි තිබූ වීරත්වයෙන් හර්ෂෝන්මාදයට පත්වන සේ පියා තමාට දක්වන ආදරයට වඩා ඈ ආදරය කළේ පියා සමාජයට දැක් වූ ආදරයටය. නිවසේ අන් කිසිවෙකු හර්ෂගේ ඒ ගුණටය අකමැති වූ බවද ඈ දැන සිටියාය.

☆☆☆☆☆☆☆☆

හදිසියේ තමා වෙත සම්ප්‍රාප්ත වූ පැරණි සිහිනයේ පාරදිගේ තැනක මේලා අතරමංව සිටියාය. සති තුනක පටන් සතිඅග පුවත්පතේ ද විශේෂ කාන්තා අතිරේකයේ ද ලිපි ලියූ ඈ දැන් නොදන්නා ප්‍රදේශයක අතරමංව සිටියාය. පාර නොදන්නා, ගමනාන්තය නොදන්නා, අවසන් කරන වේලාව, ගමනට අතර මගදී එක්වන අය ගැන නොදැන ඔහේ ගලා ගිය මේ අතරමං වීම ඇව සතුටු කරන්නට සමත්විය. අනිවාරෙන් යන්නම ඕනෑ කියලවත්, ගමනාන්තයේ කවුරුත් බලන් ඉන්නවා ඔවුන් සතුටු කළ යුතුයි කියා ඔලගුවක බරක් පැත්තකින් තබා නැංගුරම කැඩුණු නැවක් සේ ඈ සයුරේ යාත්‍රා කළාය. සුළඟට ගසාගෙන ගියත් කමක් නෑ කියලා ජීවිතය පසුපසින් එල්ලවූ බලපෑම් නොමැති මේ සොඳුරු ගමන තුළ ඈ කාර්යාලයෙන් නිවසට ආ පසු ඊමේල් පිරික්සා කර බැලුවාය.

කාන්තාවන් අසා එවූ මානසික ශාරීරික ගැටළු එක එක වර්ග කොට ඒවාට ගැළපෙන වෛද්‍යවරු සමඟ සාකච්ඡා කිරීමට කාලය සාදා ගත්තාය. ළමාරෝග පිළිබඳ උනන්දුවෙන් ලිපි ලීවාය. ඇගේ ලිපි ගැන එවූ ප්‍රශංසා ලිපි කියවා සතුටු වූවාය. ඒ සෑම තත්පරයකම අනුත්තරට සිතින් ස්තුති කළාය.

"මේලා මං කතා කරන්නේ අනුත්තර"

"කියන්න අනු"

"රජීව සර් කියනවා අපි අතැරලා දාපු ආර්ටිකල් සීරිස් එක ආයෙත් පටන් ගමු කියලා"

"මොන එකද? පොඩි ළමයින්ගේ කෑම ගැන කරපු එකද?"

"ඩොක්ටර් හර්ෂ එක්ක කරපු එක."

"ඔව් ඉතිං"

"ඒක ආයෙත් කරමුලු. නුවර ළමයෙක් කෘත්‍රිම කෑමක් කාලා මැරිලත් එක්ක නේ"

"ඩොක්ටර් හර්ෂදේවන් කැමතිවෙයිද? අපි වෙන කෙනෙක් එක්ක කරමු"

"ඩොක්ටර් හර්ෂ අකමැති වෙන එකක් නෑ. මේ වෙලා තියෙන ප්‍රශ්නෙත් එක්ක හොඳ මාකට් එකකුත් තියෙයි. තව ගෘහණියෝ, අම්මලා අතරේ ඔයා ගැනත් විශ්වාසයක් තියෙනවනේ"

"අපි වෙන ඩොක්ටර් කෙනෙක් එක්ක කරමු"

"ඩොක්ටර් හර්ෂදේවන්ව මිනිස්සුන්ට විශ්වාසයි. ගියපාර ආටිකල් සීරිස් එක නැවැත්තුවම මිනිස්සු බැන බැන ලියුම් දාලා තිබ්බා."

"ඩොක්ටර්ට මරණ තර්ජන ආපු නිසානේ ඕක නැවැත්තුවේ. එයා ආයෙත් කැමති වෙයිද?"

"ඒක තමා මෙතන අභියෝගෙ. ඔයා එයාව අඳුරනවා කියලා කිව්වනේ අපි ට්‍රයි කරමු"

"බලමු" ඈ දුරකථනය විසන්ධි කළාය.

මේ හදිසියේ කඩා පැනි උභතෝකෝටිකය විසඳාගැනීමට ඇට බොහෝ මහන්සි වෙන්නට වන බව ඈ දැන උන්නාය. ඒ කෙසේ වෙනත් මේ අවස්ථාවේ එය ප්‍රතික්ෂේප කිරීමටද නොහැකි විය. ඈ මේ ගැන සිතුවාය. ප්‍රශ්නය මොකක්දැයි අමතක වන තෙක් ප්‍රශ්නය ගැන සිතුවාය. පෙර පිළිතුර අමතක වනතුරු සිතුවාය. පිළිතුරක් නැතිවම නින්දට වැටුණාය.

☆☆☆☆☆☆☆☆

"එවම් සිසිරය පුරා ගැලපු වදන් අමුණා ලියා
ලිලී ඊරිස් මල් කළඹක ගවසා
වෙන්දේසියට දැමූ නුඹේ හැඟුම් ලුවරයේ තියලා
හෙමිහිට බැස මා ළඟට වරෙන් මොනාලිසා.''

''සියවස් ගණනක් මුළුල්ලේ රසඳුනක්ව
පිනවා එක එකාගේ ඇස්
ඔය අතරේ ඇති නුඹේ සළු
උනා දැමූ හිත්
සේන් නදිය දිගේ ඇදී එන්න
ෆ්ලෙරන් සාව නුඹේ තැනක්
ඩාවින්ඩිගේ උලව් පෙම දමා හළු කර අරඹමු
ජීවිතය යළි වරක්''

"මොනාලිසා ගැන මෙච්චර දුකයිද? සාවිත්‍රී" ඇසුවේ මීනුකාගේ කවිය කියවා අවසානයේය.

"ඕක එයාට විතරක් නෙමෙයි. පිරිමි හිතට, රසඳුනක් උන විශ්වාසවන්ත ආදරයක් නොලබපු සියලු ගැහැනුන්ට" මීනුකා සිනාසෙමින් පිළිතුරු දුන්නාය.

"මට ඕවා තේරෙන්නේ නෑ" සාවිත්‍රී කවි පොතේ තව පිටුවක් පෙරළුවාය.

''ඕපපාතිකව උපන් හැඟුමක බර
තව එකෙකුට දිය නොහැකි හින්දා
ඒ හැඟුමේ ගෙල සිර කොට
මා ඉකි බින්දා
අවසන් හුස්ම හෙලූ ඒ හැඟුමේ
උණුහුම සිත යට හංගා
තනුවක ස්වර වී ගීයක පදවී
ඒ උණුසුම පිට පැන්නා''

ඔවුන්ගේ කවි වල හඬ ඇසෙන නොඇසෙන ගානට වුවද ස්වේතාට අවශ්‍ය වූයේ ඔවුන්ගේ කතා බහට එකතු වීමටය. ඒ නිසා ඇ ද කාමරයට චිත් පුටුවක වාඩි වූවාය. නමුත් ඒ කතාව ඇ එතනට ආ පසු නතර විය. එම නිසා ස්වේතා තම සටහන් පොත අතට ගෙන ලිව්වාය.

"සංස්කෘතිය කියන්නේ ශිෂ්ටාචාරය ගොඩනගා ගත්ත මිනිස්සු අපිට ඉතිරි කරලා ගිය මතකයන්. ඒ අතර මැදදි අපේ සංස්කෘතියට අලුත් කොටසක් එකතු වෙනවා. ඒවා අර සංස්කෘතියෙන් මේ සංස්කෘතියට ප්‍රගමනය උනා, මේ සංස්කෘතියෙන් පෝෂණය වුණා කියන්න අමාරුයි. බුද්ධාගමේ මිනිස්සු පන්සලේ කෝවිලකට ඉඩක් ඉතිරි කරගත්තේ ඒ සංස්කෘතිය සම්ප්‍රේෂණය වෙලා සිදුවුණු වෙනස්කමක් විදියට අනුන්ගේ ආගමක්ය කියලා අහක නොදා තමන් එක්ක හිටපු මිනිස්සු එක්ක ඒවා බෙදාගෙන රසවිඳින්න පුළුවන් ශිෂ්ට මිනිස්සු හිටියා කියලා දැනෙද්දිත් සතුටුයි. අද පන්සලේ කෝවිල ළඟ ත්‍රිශූලයේ ගැට ගහපු බාර සිංහල ද, දෙමළද කියලා වෙනසක් නැතුව මිනිස්සුන්ගේ හීන. මිනිස්සු කියන්නේ ඇවිදින හීන ගොඩක්. ඉතිං බාර ගැටගහපු ත්‍රිශූල, කොඩි දාපු බෝධීන්වහන්සේලා හීන දරාගෙන ඉන්න ධාරක, විද්‍යාව, මිත්‍යාව කොහොම උනත් ඒවා අහිංසක මිනිස්සුන්ගේ හද ගැස්ම"

ඇ පොත පැත්තකින් තබන්නට පෙර මීනුකා එය සාවිත්‍රිටද ඇසෙන්නට කීවාය.

"ආදරෙන් දුටු හීන - හීතලේ මියදෙන්නට පෙර බාරයක්
වෙන්න යමු සෙල්ලකතරගමට, කන්දස්සාමි දෙමළද?
නොඅසාම සෙනේලතා නැග්ගාලු බස් එකට"

මීනුකා කෝල බැල්මන් හෙලුවාය.

☆☆☆☆☆☆☆☆

කිරි කෝපි පාට ගැහුණු කොළඹ පරිසරය සිසාරා හමාගිය සුළඟ ළඟදී රිලැක්ස් කරපු මේලාගේ කොණ්ඩය සිප එහි දැවටී යන්නට විය. දුම් දමන චොක්ලට් පෙත්තක රසවිඳිමින් සිටි ඇගේ හිතේ තිබුණේ අනුත්තර තමාට බාරදුන් කටයුතු ගැන හා හර්ෂදේවන් සමඟ කතා කරන්නේ කෙසේ දැයි අකුරු ගැලපීමකි. ඒ අතර එතැනට අනුත්තර කඩා වැදුනේ හේමන්ත නිද්‍රාවෙන් හදිසියේ අවදිව වැඩ අතපසු කරගත්තෙකු මෙනි. ඈ ඔහු වෙනුවෙන් මිලදී ගත් එස්ප්‍රෙසෝ කෝපි කෝප්පය ඔහුට දුන්නාය.

"ඔයා ඩොක්ටව කන්ටැක් කළාද?" අනුත්තර එස්ප්‍රෙසෝ උගුරක රසවිඳිමින් ඇසුවේය.

"මං අද කතා කරන්නම්" ඈ පිළිතුරු දුන්නාය.

එකෙණෙහිම නාද වූ ඔහුගේ ජංගම දුරකථනයට ඔහු පිළිතුරු දෙන්නට විය. ඔහුගේ දුරකථනයේ පිටුපස කවරය ඈ දුටුවාය. එහි තිබුණේ අයිෆල් කුළුණේ චිත්‍රයකි. ඔහුගේ කාරයේ යතුර එල්ලා තිබුණේද අයිෆල් අකෘතියකි. ඒ අතර ඇතට විහිදුණු 'චැනල්' සුවඳ විලවුන්හි සුවඳ බවද එය ප්‍රංශයේ සුවඳ විලවුනක් බවද ඇය තෝරා බේරාගත්තය. ඔහු දුරකථනය විසන්ධි කළ පසු ඈ කතාවට මුල පිරුවාය.

"ප්‍රංශෙට හරි ආදරෙයි වගේ" ඈ කට කොනකින් සිනාසෙමින් ඇසුවාය.

"එහෙම දෙයක් නෑ" ඔහු හිස පැත්තකට බර කර සිණාසුනේය.

"නැත්තේ මොකද?"

"යකඩ ගොඩක් පරම සංකේතය කරගත්තු යුරෝපයේ සල්ලි තියෙන විචාර බුද්ධියක් නැති මිනිස්සුන්ව පිස්සුවෙන් වගේ ආකර්ශනය කරගත්තු පාවෙවී ජීවත් වෙන රටක් මගේ පරමාදර්ශී රාජ්‍ය වෙන්නේ නෑ" ඔහු කියාගෙන ගියේය. "ඔයා ඔහොම අහන්නේ අයිෆල් කුළුණ බැක් කවර් එකෙයි කීටැග් එකෙයි තිබ්බ නිසා නම් මේ හැම එකක්ම නිකං හම්බවුණේ"

ඇය තමාගේ අනුමාන කිරීමේ වැරදීම නිසා, ලැජ්ජාවට පත්ව නැවත නැවත ප්‍රශ්න කළාය.

"එහෙනම් ඔයාගේ පරමාදර්ශී රාජ්‍ය මොකක්ද? ඇමෙරිකාවද?"

"අනේ නෑ. ඇමෙරිකාවේ නිදහස මට බර වැඩියි. රැකගන්න ඕන මිනිස්සු ටිකක් මරලා එහෙන් මෙහෙන් සේන්දු වෙච්ච මිනිස්සු ටිකක් එකතු වෙලා මිස්ටේක්ස් උනත් ගන්නැති, ප්‍රාන්තෙන් ප්‍රාන්තෙට දරාගන්න බැරි තරම් වෙනසක් තියෙන රටක් මං වගේ මිනිහෙක්ට ගැළපෙන්නේ නෑ. land of the free- home of the brave කියලා කිව්වට මම ඒතරම් ෆ්‍රීත් නෑ කියන තරම් බ්‍රේව්ත් නෑ."

"ඉතිං මොකක්ද ඔයාගේ පරමාදර්ශී රාජ්‍යය?" මේලා නිකටට කම්මුල තබා ගනිමින් ඇසුවාය.

"අනාගත ශ්‍රී ලංකාව දැනට තියෙන්නේ මං වගේ මිනිස්සුන්ගේ හිත ඇතුළේ. ඒ අනාගත ශ්‍රී ලංකාව තනන්න පුළුවන් තරම් මහන්සි වෙනවා. ඒක තව කල්පෙකට නාවත් ඒක සිද්ධ වෙනකන් ශ්‍රම දායකත්වය දෙන්න මිනිස්සු හිටියා. ඉන්නවා. ඉඳීවි. ඒක මොන හරි පරම්පරාවකට මුණ ගැහීම තමයි මගේ ප්‍රාර්ථනය"

"එදාට ඔයා ඉඳීවිද? මං කියන්නේ ඔයාගෙ පරම්පරාවක කෙනෙක්වත්?"

"ඔව්. මගේ පරම්පරාව ලාංකීය පරම්පරාව. එයාලා ඉඳීවි. මං නෑ තමයි. තමන්ට නැති උනත් අනුන් වෙනුවෙන් තමාට පුළුවන් දේ කරල යන්න අපිට දෙමව්පියෝ කියල දුන්නා මතකද?"

"ඒ කොහේදිද?"

"මොනවද මුත්තේ මොකද කරන්නේ කියලා අපිට කියලා දුන්නේ. දැන් ඔයා ඇහුවෙත් ඒකෙ ළමයා ඇහුව වගේ ප්‍රශ්නයක්"

"ඔයා මුත්තා මං ළමයද?" ඈ ඔහුව සිනාගන්වන්නට උත්සාහ ගත්තාය.

"ඔයා අලුත් වැඩේ පටන් ගත්තද?" ඈ නැවතත් ප්‍රශ්න කළාය.

"මානව චිත්ත සංවේදනා ගැන මනෝවිද්‍යාත්මක ලිපි පෙළක් . තාම නමක් දැම්මේ නෑ. මුලින්ම කතාබහ වෙන්නේ මිනිසුන්ගේ අසීමිත ආදරය වෛරයෙන් වෙන හැටි" ඔහු කීවේය.

"අසීමිත ආදරය වෛරයක් වෙන්න කලින් තව බොහෝ දේවල් වෙලා නවතින්න පුළුවන් . හරියට කවියක්. ටජ්මහලක් වගේ"

"ඔව් අපිට ඕනේ අසීමිත ආලය වෛරයක් නොවී කවියක්, චිත්‍රයක් වෙලා මග නතර කරගන්න"

"ඔව් ඒක හරි" ඈ අනුමත කළාය.

"ප්‍රේමය කිරිගරුඬෙන් පිටදැම්මලුනේ ටජ්මහලක් වෙලා" මේලා ෆීනික්ස් කිරිල්ලියක් මෙන් සැරසුණු අහස දෙස බලා කීවාය.

''මම නම් හිතන්නේ ටජ් මහලෙන් පිට දාපු ප්‍රේමයට වඩා අඹුදරුවන්ට තමන් නැති දවසට වැටිලා ඉන්න ගෙයක් දහන්න මහන්සි වෙන මිනිහා ළඟ සාජහන්ට වඩා ආදරේ තියෙනවා කියලයි. අවුරුදු ගානක් ඒකට බැඳිලා හිටිය ඉසුරුමුණිය පරමාදර්ශී ප්‍රේමය. වෙනවට වඩා ඒ ඉස්සරහ හිඟමන් ගිහින් කෑම මුල බෙදාගෙන කන මිනිස්සුයි ප්‍රේමයේ පරමාදර්ශය"

"ඉරිසියාව" ඈ කෙටියෙන් පිළිතුරු දී සිනාසුනාය.

"වෛරයේ තිඹිරිගේ ළඟ ප්‍රේමය වින්නඹුකම් කරාලු! " ඔහු එවර සිනාසුනේ සැහැල්ලුවෙනි.

# 9

හෙට දිනය නික්මීමෙන් ඇරඹීමට නියමිත තමාගේ විවාහය ගැන නොඉවසිල්ලෙන් සිටි ස්වේතා තම පියාගෙන් මාස දෙකහමාරක් තිස්සේ නොදුටු ඇස්වල පිරීගිය ජීවයත්, වචනවල පිරීගිය නිර්භීත කමත් දැන් සති දෙකක සිට දකින්නීය. එයට හේතුව නැවතත් මේලා හා එක්ව රට පුරා දරුවන් බේරා ගැනීම නැවත ඇරඹීමයි. සති දෙකක් ගෙවී ගියත් වෙනදා මෙන් තර්ජනාත්මක පණිවුඩ නැවත නොආ නිසා කවිතා ද සිටියේ සැනසිල්ලේය.

ඈ තම පියාව මෙතක් කල් දුටුවේ හදිසියේ තම මුතු කරාබු දෙකන නැති කරගත් 'මුතු කරාබු පැළඳි යුවතිය' ගේ චිත්‍රය මෙන් හිස්වය. අඩපණවය. ඔහුගේ ජීවයෙන් හා තමාගේ විවාහයෙන් ප්‍රහර්ෂයට පත්ව සිටි ඇගේ නිවසේ දැන් සෑම දිනකම ඩස්කි රෝසස්, සල්මල් ද පිදී තිබෙනු ඈ දුටුවාය. ජීවිතයේ හැම තත්පරයක්ම ජීවයේ පණිවුඩකරු ලෙස ඈ සිතුවාය.

කවිතාද ජීවිතයට පැමිණි උදෑහනසේ මේ සෘතුව ගැන සිතුවාය. ජීවිතයේ වැටකෙයියා කටු ඇනී රිදුම්දෙන තැන්වල ඇති වූ තුවාල දැන් සුව වී ඇති බව ඈට දැනිණ. සාවිත්‍රි ද ජීවිතය දෙස ඇඟිල්ලෙන් ඇන නොව කවුළුවෙන් එබී බැලිමට ටිකෙන් ටික ඉගෙන ගෙන සිටියාය.

එක්තරා කාර්තුවක අවසානයේ ජීවිතයේ හොඳම කාර්තුවක් ඇරඹීමට නියමිතව ඊට පෙර, අවසන් කාර්තුවටද, එළඹීමට නියමිත කාර්තුවටද අයිති නොවන විරාමයක, නිසලතාවයේ ගිලුණු දිනය ස්වේතාට දැණුනේ පිටේ හරිමැද දහදිය ගලා යන සීමාව ලෙසය. ඉක්මනින් ගලා හැලෙන, කලාවකින් ඇද වැටෙන දිනයක් ලෙසය. අහස ගැබ්බරව ස්වේත වළාකුළු දරගෙන විසල් අහස මත විසිරුණු වළාකුළු එකිනෙකා විටින් විට ළංව ආලයේ ගාථා මතුරන වග ඇට සිතිණි. ඒ ආලයේ ජපයෙන් බෙන්සාරු කෙරූ පිණිපොද රෝස පාත්තියේ තැනින් තැන ලැගුම් ගෙන සිටිණු ඈ දුටුවාය.

ජීවිතයේ භාවනාවට කමටහන් දෙන ආලය ඊමානයේ කොටසක් වගද සිතුවාය. එකී මෙකී නොකී වර්ගයේ ආදරෙන් උපත ලබන්නට නියමිත හෙට දිනයේ බයිබලය මත අත තබා දිවුරන්නට නියමිත ජීවිතය ගැබ්ගත් ඇගේ හදවත වේලයෙන් වසා සිටින්න විය.

බොහෝ කාලයක් තිස්සේ කරක් ගසා ආ මේ දිගු ගමනේ අවසානයේ අනේකාලංකාර වූ උත්තරීතර සිහිනයක් දුටු හර්ෂදේවන් හෙට අනිද්දාට තම ජීවිතයේ අසීමිත ස්නේහයකින් ලග උන්නු ඇව තවකෙකුට දීමට සිත හදා ගැනීමට උත්සහ ගනිමින් කළුත් නොවූ-සුදුත් නොවූ අළු පාට ඒ ඇසිල්ල නිර්වින්දිත ලෙස ජීවින් වුණේය.

"සෙනෙහසින් ලග උන්නු රොබොරෝසියන් මල් මිටක්
පෙති සලා බිම උන්නා සරසමින් වැව රවුම ළග බංකුවක්
අතැර ගිය පසු ඒ මල්පෙතිත් නුවර වීදියක්
රොබොරෝසියන් ගහ පාමුල ඉතිරි උනේ පරන පාලු තනිකමක්"

මීනුකා තම පියගේ ලිපි පෙලක් කියවමින් සෝෆාවේ වැතිර උන්නාය. නිශ්ශබ්දතාවයේ ගිලී තිබුණ ඒ නිවස අද රෑට කාර්යබහුල වී මංගලසිරි ගන්නා ආකාරය ගැන ඈ සිතමින් උන්නාය. මේ හැමදේම අතරතුර සතිදෙකක් ලිපි ලීවත් කිසිඳු තර්ජනාත්මක බලපෑමක් හෝ දුරකථන ඇමතුමක් නොලැබීම නිසා ඈ සැනසිල්ලේ හුස්ම ගත්තාය.

සයුරු මායිමේ සිට සයුර තරණය කිරීම විනිශ්චය නොකළ යුතු බව මෙවන් දනිතත් සයුරු මායිමේ සිට බැලූ සුන්දර දසුන මෙන් සයුර තරණය කිරීමද පහසු වේවා යැයි ඔහු ප්‍රාර්ථනා කළේය. හදවතේ අඳුරු අහු මුළු වලට පවා හිරු පායන්නට නියමිතව එළඹෙන දිනය ගැන සිතමින් දහවල අහසට යටින් ගෙවී යන්නට විය.

"ඔව් දැන් අලුත් ලිපි දෙකක් පළ වුණා දෙවෙනි ලිපි හොඳටම ලිව්වා. සියලුම ආයතනවල නම් එක්ක. තුන්වෙනි එක කරන්න ඕන. ඩොක්ටර්ගෙ දුවගෙයි, මගේ මල්ලිගෙයි වෙඩිං එකට පස්සෙ. ඒක අනිද්දනේ මං ඔයාට පස්සේ ගන්නම් අනූ" මේලා දුරකථනය විසන්ධි කළාය.

ඇ සිටියේ එළඹෙන දිනයට ඇඳුම් ආයිත්තම් ගළපමිනි. බොහෝ කාලෙකට පසු ලංකාවට එන්නට නියමිත තම ස්වාමිපුරුෂයා පිළිගැනීමට ද ඈ සිටියේ හෙට රෑ වනතුරු නොඉවසිල්ලෙනි. ඒ අතර ඇගේ ආත්ම තෘප්තිය ගොඩ නැගුනේ ලිපි ලිවීම ගැන තමා ලැබූ ප්‍රශංසා හා ආශිර්වාදය. ඒ අතර මව්වරු, ගුරුවරු, සමාජ ක්‍රියාකාරීන් ද විය. වෛද්‍ය හර්ෂදේවන් සමඟ කළ ලිපි පෙළට ලැබුණු ප්‍රතිචාර එහි ඉහළ තැනක තිබිණි.

★★★★★★★★

"අම්මා, මං අප්පාගේ ඩ්‍රයිවර් එක්ක අකීව එක්කගෙන එන්නම්. අම්මා අප්පා එක්ක ගිහිං අම්මගේ කාර් එකේ ජුවෙලරි ෂොප් එකට යන්න" ඒ ස්වේතාය.

"ඔයා ගෙදර ඉන්න. ඩ්‍රයිවර්ට කියන්න අකිනම්ව අරං එන්න කියලා" කවිතා කීවේ හර්ෂදේවන් සමඟ සාප්පුවට යාමට සූදානම් වෙමිනි.

"මම දැන් ඇඳගත්ත එකේ යන්නම්" ඈ කීවේ යාමට හදිසියෙනි.

"හරි, එහෙනම් මායි අප්පයි ගෙදර එන්න කලින් ගිහින් එන්න"

"හරි මං එහෙනම් අප්පගේ කාර් එකේ ඩ්‍රයිවර් එක්ක යනවා" ඈ කීවේ හර්ෂට ඇහෙන ලෙසය.

"පරිස්සමින් යන්න" කවිතා ඇගේ නළලත සිම්බාය.

☆☆☆☆☆☆☆☆

"සමාජයට ආදරේ කරපු, සමාජෙට ආදරේ කරපු මිනිස්සුන්ට කවදහරි දවසක අවසන් සුසුම වා තළයට හෙලන්න වෙන්නේ අකාලයට වුණත්, කාලයට උනත් ඔවුන් වළලපු තැන්වල පිපෙන මලකින් ඒ ආත්මයන් වල සුවඳ දසත පැතිරෙනවා. සමාජයට ආදරය කරලා මැරෙන එක ඒවගේ දෙයක්. අනික තමන්ගෙ අදහස් වෙනුවෙන් මැරෙන මිනිස්සු ගැන දුක් වෙන්න ඕන නෑ කියල මං අහල තියෙනවා. සීයට සීයක් අවංක වෙන්න බැරි උනත්, මරණෙන් පස්සෙ ස්වර්ගීය සැපත හොයන්න විතරක් නෙමෙයි, ජීවත් වෙන කාලේ මනුස්සකම් වලින් පිරෙන්නත්, මරාගෙන මැරෙන්න නෙවෙයි බෙදාගෙන හිනෙහෙන සමාජයක් බිහි කරන්න පුළුවන් නම් අවංකකම, ආදරය කියන්නේ කලාවට වෙන්වුණු වචන විතරක් නොවෙන්න තිබ්බා. මේක ඒ වෙනුවෙන් වෙහෙසුණු මිනිස්සු වැළලුන පොළොවක්. ඒකයි අපි ඒ පොළොවට ආදරේ"

වසර දෙකකුත් මාස තුන අගිස්ස ස්වේතාගේ සටහන් පොතේ ලියැවුණු මාර්තු 29 සටහන කියවා මීනුකා පොත පැත්තකින් තැබුවාය. ස්වේතා අවුරුදු ගාණක් රැකබලාගත් රෝස පාත්තියද, වැනිලා පාට බාබටන් මල් පාත්තිය නොපෙනෙන තරමට එහි ඔවුන්ගේ නෑයන් මිතුරන් පිරී සිටින වග මීනුකා දුටුවාය.

ඒ අතර ගේට්ටුවෙන් ඇතුළට මෙවන් එනවා දුටු විට මීනුකා ඔහු කරා ඇවිද ගියාය. ඔහු රැගෙන ආ ඇරම් ලිලී මල් කලඹ සාවිත්‍රි අතට ගත්තේ ප්‍රවේසමෙනි.

ඔහුගේ දුරකථනය නාද වූ නිසා ඔහු එයට පිළිතුරු දීමට සාක්කුවෙන් දුරකථනය එළියට ගෙන වෝල්පේපරය දෙස බැලුවේය. එහි අකිනම් ගේ නම සටහන් වූ නිසා ඔහු එයට ඉක්මනින් ප්‍රතිචාර දැක්වූවේය.

"ගවුම ෆ්ලෝරල් වයිට් නිසා බොකේ එකට ලිලී තියන්නද? රෝසස් තියන්නද?" අකිනම් ඇසුවේය.

**"ඩස්කි රෝසස්"**

දුරකථනය විසන්ධි කළ ඔහුගේ දෙනෙත් අගින් කඳුළු බිඳුවක් ගලා හැලෙන්නට විය.

ඒ ගෙදර කණ්ඩියේ වාරු නැතිව වාඩි වී සිටි මේලාට අනුත්තරගෙන් ආ ඇමතුමට ඈ පිළිතුරු දීමට සල්ගස ළඟ බංකුව උඩට ගියාය.

"අපිත් මේ මරණෙට වග කියන්න ඕනේ අනු. ඩොක්ටර් හර්ෂ මේක නවත්තල තිබ්බේ මරණ තර්ජන ආපු නිසා. අපියි බල කරලා ආයෙත් ලියමු කිව්වේ. මේ පාර ඒ මිනිස්සු තර්ජනය නොකරම මරල දැම්මා. ඩොක්ටර්ගේ ඩ්‍රයිවර් එක්ක ඩොක්ටර් කාර් එකේ ගිහිං තියෙන්නේ ස්වේතා. එයාගෙ ඩ්‍රෙස් ඩිසයිනර්ව ගෙදරට එක්කං එන්න. ස්වේතයි ඩ්‍රයිවයි තමයි ඊයේ හවස කාර් ක්‍රෑෂ් එකට අහුවෙලා තියෙන්නේ. කාර් එක හොඳටම ගිනි අරන්. හවස 6ට මෙට්ලන්ඩ් ස්ට්‍රීට් එකේ cctv නැති තැනක ඩොක්ටර්ව ඒම් කරපු එකට අහුවුණේ ස්වේතවයි, ඩ්‍රයිවර්වයි. මේ හදිස්සියේ අපි අපරාදේ මේක පටන් ගත්තේ" ඈ සුසුමක් හෙළා බංකුවට ඔළුව බර කළාය.

තෙමසක අගිස්ස ස්වේතාව වැළලූ තැන සෑදූ ඵලකය ළඟ ඩස්කි රෝසස් මල් කළඹක් තබා කාරයට නැගුණු මෙවන් කනත්ත පසු කරගෙන වික්ටෝරියා හීල් මාවතට කාරය දැමුවේය.

එකණෙහිම අසනි වර්ෂාවත් ඇද හැලිණ.

නිමි.